# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත

---

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 3.75 යි

තැපැල් ගාස්තුව රු. 1.50 යි

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 57/80.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIII වන පරිච්ඡේදය ප්‍රකාර ජනමත විචාරණයක් පැවැත්වීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

## I වන කොටස

### ප්‍රාරම්භය

2. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ප්‍රකාශනයකින් ජනමත විචාරණයක පැවැත්වීමට (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමසාරිස්වරයාට ජනාධිපතිවරයා විසින් විධාන කරනු ලැබූ අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIII වන පරිච්ඡේදය ප්‍රකාර ජනමතවිචාරණයක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබිය යුතු ය. *ජනමත විචාරණයක් පැවැත්වීම ජනාධිපතිවරයා විසින් විධාන කළ යුතු බව.*

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක—

(අ) ජනමතවිචාරණයේ දී ජනතාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වූ යෝජනාව, "ඔව්" හෝ "නැත" යනුවෙන් උත්තර දිය යුතු වූ ප්‍රශ්නයක ආකාරයෙන් නිශ්චිතව සඳහන් කළ යුතුය ; තව ද

(ආ) ඒ ජනමතවිචාරණයේ දී ඡන්ද විමසීම සඳහා දිනයක් නියම කළ යුතු ය. ඒ දිනය—

(i) ප්‍රකාශනය පළකිරීමේ දින සිට දින තිහකට කලින් නොවන දිනයක් විය යුතු ය ;

(ii) පුර පසළොස්වක පෝය දිනයක් හෝ 1971 අංක 29 දරන නිවාඩු පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් රජයේ නිවාඩු දිනයක් නොවන දිනයක් විය යුතු ය ; තව ද ප්‍රකාශනය පළ කිරීමෙන් පසුව ඒ ප්‍රකාශනයෙහි සඳහන් දිනය රජයේ නිවාඩු දිනයක් බවට ප්‍රකාශ කරනු ලැබුවේ නම්, ඒ ප්‍රකාශය, ජනමතවිචාරණය පැවැත්වීමේ කාර්යය සඳහා ඒ දිනයේ දී කරන ලද යම් දෙයක වලංගුභාවයට කිසිම ආකාරයකින් බල නොපෑ යුතු ය.

3. (1) තත් කාලයෙහි බලපවත්නා එක් එක් මැතිවරණ කොට්ඨාසය මේ පනතේ කාර්ය සඳහා මැතිවරණ කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතු ය. *මැතිවරණ කොට්ඨාස, ඡන්ද ප්‍රදේශ ආදිය.*

(2) තත් කාලයෙහි ක්‍රියාත්මක වන එක් එක් ඡන්ද ප්‍රදේශය සහ එක් එක් ඡන්ද කොට්ඨාසය, මේ පනතේ කාර්ය සඳහා ඡන්ද ප්‍රදේශයක් සහ ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඡන්ද පොළවල්.

4. (1) 2 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශනය පළ කිරීමේ දින සිට සති තුනක් ඇතුළත, එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා ඡන්ද පොළේ හෝ ඡන්ද පොළවල්වල සහ ඡන්ද දායිකාවන් සඳහා වෙන් කරන ලද යම් විශේෂ ඡන්ද පොළක් වෙතොත්, එහි පිහිටීම සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට කොමසාරිස්වරයා විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) යම් ඡන්ද කොට්ඨාසයක ඡන්ද දායිකාවන් සඳහා වෙනම ඡන්ද පොළක් සැලැස්වීම, යම් අවස්ථාවක විශේෂ අවස්ථානුගත කරුණු අනුව, අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන්නේ නම් මිස, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා එක් ඡන්ද පොළක් තිබිය යුතු අතර, ඊට වැඩි ගණනක් නොතිබිය යුතු ය.

(3) යම් ඡන්ද කොට්ඨාසයක ඇති අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ ඡන්ද කොට්ඨාසයෙන් පිටත ඡන්ද පොළක් පිහිටුවීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වූ අවස්ථාවක හැර, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා ඡන්ද පොළක් හෝ ඡන්ද පොළවල්, ඒ ඡන්ද කොට්ඨාසය ඇතුළත පිහිටුවනු ලැබිය යුතු ය. ඡන්ද පොළ පිහිටුවීම, ඡන්ද කොට්ඨාසයේ ඡන්ද හිමියනට අවම අපහසුතාව ඇතිවන පරිදි විය යුතු ය.

(4) යම් හදිසි අවස්ථාවක් නිසා යම් ඡන්ද පොළක පිහිටීම (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමක සඳහන් පිහිටීමට වෙනස්වීම අවශ්‍ය වන අවස්ථාවක, ස්වකීය පරම අභිමතය අනුව තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ඒ ඡන්ද පොළෙහි පිහිටීම වෙනස් කිරීමට කොමසාරිස්වරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

ඡන්ද හිමි නාම ලේඛන.

5. ප්‍රකාශනය පළ කිරීමෙන් පසු අලුත් නාම ලේඛනයක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වුව ද මේ පනතේ කාර්ය සඳහා යම් මැතිවරණ කොට්ඨාසයක දී පාවිච්චි කරනු ලබන ඡන්ද හිමි නාම ලේඛනය 2 වන වගන්තිය යටතේ ඒ ප්‍රකාශනය පළ කරන ලද දිනයේ දී ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ක්‍රියාත්මක වන ඡන්ද හිමි නාම ලේඛනය විය යුතු ය.

ඡන්ද හිමි නාම ලේඛනය ඡන්දය දීමට ඇති අයිතිය සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

6. 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනය පළ කරන දිනයේ දී ක්‍රියාත්මක වන යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්ද හිමි නාම ලේඛනය, ජනමතවිචාරණයක දී ඡන්දය දීමට යම් තැනැත්තකුට හිමිකම ඇත්තේ දැයි හෝ හිමිකම නැත්තේ දැයි තීරණය කිරීමේ කාර්යය සඳහා තීරණාත්මක සාක්ෂි විය යුතු ය. තව ද යම් නාම ලේඛනයක තත් කාලයෙහි නම ඇතුළත් වන්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තාගේ ඡන්දය දීමේ අයිතියට නාම ලේඛනයෙහි ඒ තැනැත්තාගේ නම ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ විනිශ්චයට භාජනව

පවත්නා යම් අභියාචනයකින් හානියක් නොවිය යුතු ය. තව ද එවැනි යම් අභියාචනයක් විනිශ්චයට භාජනව ඇති කාලය තුළ දී එවැනි යම් තැනැත්තකු විසින් දෙන ලද යම් ඡන්දයක්, එවැනි කිසිම අභියාචනයක් විනිශ්චයට භාජනව නොපැවතියාක් මෙන් වලංගු ඡන්දයක් විය යුතු අතර, අභියාචනය පිළිබඳව තදනන්තරව කරනු ලබන තීරණයෙන් ඊට හානියක් නොවිය යුතු ය:

එසේ වුව ද දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් නිසා හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් නිසා හෝ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් ජනමතවිචාරණයක දී ඡන්දය දීමෙන් අශක්තුතාවට පත් කරනු ලැබූ යම් තැනැත්තකු ජනමතවිචාරණයක දී ඡන්දය දෙතොත්, ඔහු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක කාලයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ යටත් විය යුතු ය:

එසේ ම තවදුරටත් පෞද්ගලිකව ඡන්දය දීමට අදාළ 9 වන වගන්තියේ විධිවිධාන හෝ බහු ඡන්ද දීමට අදාළ 25 වන වගන්තියේ විධිවිධාන හෝ කඩ කිරීමක් සම්බන්ධයෙන් යම් දණ්ඩනයකට යම් තැනැත්තකු යටත් කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය.

ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා සහ තේරීම් භාර නිලධරයෝ.

7. (1) අවස්ථාවට අවශ්‍ය විය හැකි පරිදි, කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයෙහි වූ දැන්වීමක් මගින් ජනරජයේ ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා වශයෙන් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය යුතු ය. තව ද තම කාර්ය ඉටු කිරීමේ දී ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයාට සහාය වීම පිණිස එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක්, නමින් හෝ ධුරයෙන් පත් කළ හැකි ය. ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයාට සහාය වීම පිණිස එසේ පත් කරන ලද තැනැත්තකුට සියලු බලතල තිබිය යුතු ය. තව ද ඔහු පත් කරනු ලැබුවේ යම් නිලධරයකුට සහාය වීම පිණිස ද, ඒ නිලධරයාගේ සියලු කාර්ය ඔහු විසින් ඉටු කරනු ලැබිය හැකි ය. තව ද පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා සම්බන්ධයෙන් යම් සඳහන් කිරීමක, සහකාර ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයකු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවට අවශ්‍ය විය හැකි පරිදි, කොමසාරිස්වරයා විසින්, එක් එක් මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා වශයෙන් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් පත් කළ යුතු ය. තව ද ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තේරීම් භාර නිලධරයාට සහාය වීම පිණිස එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය. තේරීම් භාර නිලධරයාට සහාය වීම පිණිස එසේ පත් කරනු ලැබූ තැනැත්තකුට සියලු බලතල තිබිය යුතු අතර, ඔහු පත් කරනු ලැබුවේ යම් නිලධරයකුට සහාය වීම පිණිස ද ඒ නිලධරයාගේ සියලු කාර්ය ඔහු විසින් ඉටු කරනු ලැබිය හැකි ය. තව ද මේ පනතෙහි තේරීම් භාර නිලධරයකු සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමක පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, සහකාර තේරීම් භාර නිලධරයකු සම්බන්ධයෙන් වූ සඳහනක් ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද පත්වීමක්, කවර හෝ අවස්ථාවක ඔහු විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා හෝ යම් තේරීම් භාර නිලධරයකු රෝගාතුරවීමේ හෝ වෙනත් හේතුවක් නිසා හෝ මේ පනත යටතේ වූ තම කාර්යවලින් යම් කාර්යයක් ඉටු කිරීම වළක්වනු ලැබුවහොත් හෝ කළ නොහැකි වුවහොත් සහ කොමසාරිස්වරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබීමට කාලය නොමැති වුවහොත්, අවස්ථාවෝචිත පරිදි, ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා හෝ තේරීම් භාර නිලධරයා විසින්, තමා වෙනුවට වැඩ බැලීම සඳහා නියෝජ්‍යයකු, නමින් හෝ ධුරයෙන් පත් කළ හැකිය. එවැනි සෑම පත්වීමක් ම හැකිතාක් ඉක්මණින්, කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර, ඒ නියෝජ්‍යයා විසින්, ඒ වන විටත් කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොමැතිව, කොමසාරිස්වරයා විසින් ඒ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ඡන්ද විමසීම

ජනමතවිචාරණ නියෝජිතයන් පත් කිරීම.

8. (1) යම් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් විසින්, එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා ජනමතවිචාරණ නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි ය. තව ද එසේ පත් කරන ලද එක් එක් ජනමතවිචාරණ නියෝජිතයාගේ නම සහ ලිපිනය 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනයක් පළ කිරීමේ දින සිට, දින දහයක් පසු නොවී ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයාට ලැබෙන පරිදි සැපයිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යථා පරිදි පත් කරනු ලැබ, ඒ උපවගන්තියෙන් නියම කරන ලද පරිදි ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා වෙත නම සහ ලිපිනය සපයන ලද ජනමතවිචාරණ නියෝජිතයකුට, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි, ඡන්ද නිරීක්ෂකයන් සහ ගණන් කිරීමේ නිරීක්ෂකයන් පත් කිරීමට බලය ඇත්තේ ය.

(3) ජනමතවිචාරණ නියෝජිතයකු හෝ ඡන්ද නිරීක්ෂකයකු හෝ ගණන් කිරීමේ නිරීක්ෂකයකු හෝ පත් කිරීම පැහැර හැරීමෙන් හෝ මේ පනත යටතේ යම් කටයුතුවල දී ඔවුන්ගේ නොපැමිණීමෙන් හෝ ජනමතවිචාරණයක යම් කටයුතු අවලංගු නොවිය යුතු ය.

තැපැලෙන් ඡන්දය දීම.

9. (1) යම් ජනමතවිචාරණයක කාර්යය සඳහා තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීමට මේ වගන්තිය යටතේ හිමිකම ඇති තැනැත්තකු විසින්, තැපැලෙන් ඡන්දය දෙනු ලැබිය හැකි අතර, ඒ ජනමතවිචාරණයේ දී ඔහු පෞද්ගලිකව ඡන්දය නොදිය යුතුය. මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩකරමින් යම් ජනමතවිචාරණයක දී පෞද්ගලිකව ඡන්දය දෙන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට

දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් මැතිවරණ කොට්ඨාසයක තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු විසින් හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, තැපැල් දෙපාර්තමේන්තුවේ හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක නිලධරයකු නැතහොත් සේවකයකු විසින් ඒ සාමාජිකයා, නිලධරයා නැතහොත් සේවකයා වශයෙන් තම සේවා නියුක්තියේ විශේෂ අවස්ථානුගත කරුණු හේතුවෙන් තමාට වෙන් කරනු ලැබූ ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ඡන්දය දීමට නොහැකි වීමේ හෝ නොහැකි වීමට ඉඩ ඇතිවීමේ හේතුව නිසා එවැනි යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් ;

(ආ) ඡන්දය විමසන දිනයේ දී ජනමතවිචාරණය හා සම්බන්ධ කාර්යයක් සඳහා තමා සේවයෙහි නියුක්ත කරනු ලැබීමට අදාළ විශේෂ අවස්ථානුගත කරුණු නිසා හෝ ඒ කාර්යය සඳහා තමා සේවයෙහි නියුක්ත කරනු ලැබීමට ඉඩ ඇතිවීමේ හේතුව නිසා රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු විසින්

කරනු ලැබිය හැකි ය.

(3) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක්, 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනය පළ කිරීමේ දින සිට දින දහයක් ඇතුළත, තේරීම් භාර නිලධරයාට ලැබෙන පරිදි කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීම, මේ පනතේ පළමුවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් තත් කාර්යය සඳහා නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(4) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූල බවට තේරීම් භාර නිලධරයා සෑහීමට පත්වන්නේ නම් මිස, එවැනි ඉල්ලීමකට තේරීම් භාර නිලධරයා විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් සුදුසුසක් කිරීමේ කාර්යය සඳහා තේරීම් භාර නිලධරයා විසින්, තත් කාර්යය සඳහා අවශ්‍ය විය හැකි එවැනි යම් තොරතුරු ඒ නිලධරයාට දීමට යම් තැනැත්තකුට දැන්වීමකින් නියම කරනු ලැබිය හැකි ය.

(6) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳව තේරීම් භාර නිලධරයාගේ තීරණය ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමකට ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හෝ තේරීම් භාර නිලධරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(8) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමකට තේරීම් භාර නිලධරයකු විසින් ඉඩ දෙනු ලැබූ විට, ඉල්ලුම්කරු, ජනමතවිචාරණයේ කාර්යය සඳහා තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති තැනැත්තකු විය යුතු ය.

(9) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති එක් එක් තැනැත්තා වෙත හැකිතාක් ඉක්මණින් පහත දැක්වෙන ලේඛන ඒ තැනැත්තා විසින් සපයන ලද ලිපිනයට, තේරීම් භාර නිලධරයා විසින් තැපැලෙන් යැවිය යුතු ය:—

(අ) ඡන්ද පත්‍රිකාවක් ;

(ආ) අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ ආකෘතියක් ;

(ඇ) මේ උපවගන්තියේ (ඈ) ඡේදයෙහි සඳහන් ලියුම් කවරයට වඩා කුඩා විය යුතු වූ ද, "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යනු වෙන් ලකුණු කරනු ලැබුවා වූ ද, ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවේ මුද්‍රිත අංකය ලකුණු කරනු ලැබුවා වූ ද, යථා පරිදි ලකුණු කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාව ආපසු යවනු ලබන විට, එය බහාලිය යුතු ලියුම් කවරයක් ; සහ

(ඈ) ඉහත සඳහන් ලේඛන ආපසු යැවීම සඳහා ලියුම් කවරයක්.

(10) තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති තැනැත්තන් විසින් පාවිච්චි කරනු ලැබිය යුතු ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය සහ අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඒවා නිකුත් කිරීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය මේ පනතේ පළමුවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග අනුව විය යුතු ය.

(11) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති තැනැත්තකුට නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාවක්, මේ පනතෙහි "තැපැල් ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(12) තේරීම් භාර නිලධරයා විසින් (මේ පනතෙහි "තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය සහ ඡන්ද හිමි නාම ලේඛනයේ අංකය සඳහන් ලැයිස්තුවක් හැකිතාක් ඉක්මණින් පිළියෙල කළ යුතු ය. ඒ ලැයිස්තුව, මේ පනතේ පළමුවන උප ලේඛනයෙහි ඇතුළත් නියෝග අනුව පිළියෙල කරනු ලැබිය යුතු ය.

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව.

10. (1) එක් එක් මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිල ධරයා විසින් ඒ මැතිවරණ කොට්ඨාසයේ නාම ලේඛනයෙහි නම දැක්වෙන එක් එක් ඡන්දහිමියා වෙත පහත සඳහන් කරුණු සඳහන් කෙරෙන කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකෘතියක් අනුව වූ (මේ පනතෙහි "නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු ය:—

(අ) මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය ;

(ආ) ඡන්දහිමියාගේ නම , සුදුසුකම් ලැබීමේ ලිපිනය සහ නාම ලේඛනයෙහි දක්වා ඇති පරිදි ඡන්දහිමියාගේ ලියාපදිංචි අංකය ;

(ඇ) ඡන්ද ප්‍රදේශය ;

(ඈ) ඡන්ද කොට්ඨාසය ;

(ඉ) ඡන්දහිමියා වෙනුවෙන් වෙන් කර දෙන ලද ඡන්දපොළ;

(ඊ) ඡන්දය විමසීමේ දිනය සහ වේලාව:

එසේ වුවද තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති ඡන්දහිමියකු වෙත එවැනි පත්‍රිකාවක් නොයැවිය යුතු ය.

(2) ඡන්දය විමසන දිනයට යටත් පිරිසෙයින් දින හතකට පෙර ඡන්දහිමියාට ලැබෙන පරිදි, නිල ඡන්ද දන්වීම් පත්‍රිකාවක් සාමාන්‍ය තැපෑලෙන් ඔහු වෙත යැවිය යුතු ය. ඒ පත්‍රිකා වෙහි ලිපිනය සඳහන් තැනැත්තාට එය භාර දීමට තැපැල් කාර්යාලයක් අපොහොසත් වන අවස්ථාවක, ඡන්දය විමසන දිනය තෙක්, එය ඒ තැපැල් කාර්යාලයෙහි රඳවා ගනු ලැබිය යුතු අතර, ලිපි හිමියා විසින් එය ඉල්ලා සිටියහොත්, ඔහුට භාර දෙනු ලැබිය යුතු ය.

(3) (අ) යම් නිල ඡන්ද දන්වීම් පත්‍රිකාවක්, බලය නොමැතිව වෙනත් යම් තැනැත්තකුට සපයන; හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකුට යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන නැතහොත් වෙනත් යම් තැනැත්තකුගෙන් යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් මිලයට ගන්නා හෝ මිලයට ගැනීමට ඉදිරිපත් වන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය .

(4) රජයේ නිලධරයකු වශයෙන් ස්වකීය කාර්ය ඉටු කරන රජයේ සේවකයකු නොවන්නා වූ ද, වෙනත් යම් තැනැත්තකුගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තමාගේ සන්තකයෙහි තබාගෙන ඇත්තා වූ ද, සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරද කරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

11. (1) කොමසාරිස්වරයා විසින් දෙනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එක් එක් තේරීම් භාර නිලධරයා විසින් තම මැතිවරණ කොට්ඨාසයෙහි එක් එක් ඡන්ද පොළ භාරව කටයුතු කිරීම සඳහා මෙහි මින් මතු ඡන්ද ස්ථානාධිපති වරු යනුවෙන් හඳුන්වනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් පත් කළ යුතු අතර, ඔහුගේ හෝ ඔවුන්ගේ පත්වීම තේරීම් භාර නිලධරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය. යම් ඡන්ද පොළකට එක් ඡන්ද ස්ථානාධිපතිවරයකුට වැඩි ගණනක් පත් කරනු ලැබුවහොත්, තේරීම් භාර නිලධරයා විසින් ඒ

ඡන්ද ස්ථානාධිපතිවරු.

ඡන්ද ස්ථානාධිපතිවරයන් අතුරින් එක් තැනැත්තකු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ලෙස පත් කළ හැකි ය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සෙසු ඡන්ද ස්ථානාධිපතිවරයන් විෂය යෙහි ද, ඒ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම පැවැත්වීම සඳහා යොදා ඇති සියලු වැඩ පිළිවෙලවල් පිළිබඳව ද, සාමාන්‍ය අධීක්ෂණය කළ යුතු ය.

(2) අසනීපයක් හෝ වෙනත් හේතුවක් නිසා යම් ජනමත විචාරණයක දී කටයුතු කිරීමෙන් යම් ඡන්ද ස්ථානාධිපතිවරයකු වැළැක්වෙතොත් සහ තේරීම් භාර නිලධරයා විසින් වෙනත් තැනැත්තකු පත් කිරීමට කාලයක් නොමැති වුවහොත් තමා වෙනුවෙන් වැඩ බැලීම පිණිස නියෝජ්‍යයකු ඡන්ද ස්ථානාධිපති වරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම පත්කිරීමක්ම හැකිතාක් ඉක්මණින් තේරීම් භාර නිලධරයා වෙත වාර්තා කළ යුතු අතර, ඒ පත්වීම ඒ නියෝජ්‍යයා විසින් එවකටත් කර ඇති යම් දෙයක වලංගුභාවය කෙරෙහි හානියක් නොමැතිව, තේරීම් භාර නිලධරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) යම් ඡන්ද පොළක් භාරව කටයුතු කිරීම සුදුසු යයි තේරීම් භාර නිලධරයා කල්පනා කරන්නේ නම්, ඔහු විසින් එසේ කළ හැකි අතර, ඡන්ද ස්ථානාධිපතිවරයකු සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන, ඒ තේරීම් භාර නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඡන්ද පොළවල්වල සැලැස්විය යුතු පහසුකම්.

12. (1) ජනමතවිචාරණයක කාර්ය සඳහා තේරීම් භාර නිලධරයා විසින්—

(අ) ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් පත් කළ යුතු ය;

(ආ) යම් කිසි වේලාවක දී ඡන්දදායකයන් සාධාරණ සංඛ්‍යාව කට ඉඩ කඩ සැලසීම පිණිස සහ ඔවුන් ස්වකීය ඡන්ද පත්‍රිකා ලකුණු කරන විට, ඔවුන් නොපෙනෙන පරිදි ආවරණය වී ඇති බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය තරම් ආවෘත ස්ථාන යම් සංඛ්‍යාවක් එක් එක් ඡන්ද පොළෙහි සැපයිය යුතු ය;

(ඇ) එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ඡන්ද පොළට වෙන් කර ඇති ඡන්ද හිමියන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාමලේඛනයේ ඒ කොටසෙහි පිටපතක් සහ ඒ පිටපතෙහි ඡන්ද හිමියන්ගේ නම් අතුරින් තැපැල් ඡන්දදායකයන්ගේ නාමාවලියෙහි නම් ඇතුළත් වෙන ඡන්ද හිමියන්ගේ නාමාවලියක් ඒ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත සැපයිය යුතු ය. ඒ එක් එක් ඡන්ද ස්ථානාධිපති වරයා වෙත සපයනු ලබන ඒ නාමලේඛනයේ කොටසෙහි තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම ඡන්දහිමියකුගේ ම නම ඉදිරියෙන් හඳුනා ගැනීමේ ලකුණක් තැබිය යුතු ය;

(ඈ) ඒ ඡන්ද පොළට වෙන් කර ඇති ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව සඳහා, තේරීම් භාර නිලධරයාගේ මතය අනුව, අවශ්‍ය විය හැකි ඡන්ද පෙට්ටි සහ ඡන්ද පත්‍රිකා යම් සංඛ්‍යාවක් එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත සැපයිය යුතු ය;

(ඉ) ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකා ලකුණු කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය ද්‍රව්‍ය ද, ඡන්ද පත්‍රිකාව මත නිල ලකුණ සිදුරු කිරීම හෝ මුද්‍රා තැබීම සඳහා, අවශ්‍ය උපකරණ ද, එක් එක් ඡන්ද පෙළට සැලැස්විය යුතු ය;

(ඊ) මේ පනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ජනමත විචාරණය ඵලදායි ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය වෙනත් ක්‍රියා සහ දේ කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා නොකිරීමේ හේතුව මත හෝ ඡන්ද පොළවල් සම්බන්ධයෙන් වූ යම් විධිහීනතාවයක හේතුව මත හෝ ජනමතවිචාරණයක් විවාදයට භාජන නොකළ යුතු ය.

13. (1) ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර, සෑම ඡන්ද පොළක ම ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්— ඡන්ද පොළවල ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම්.

(අ) ඡන්ද පොළෙන් පිටත සහ එහි සෑම ආවෘත ස්ථානයකම, ඡන්දදායකයන්ගේ මග පෙන්වීම සඳහා උපදෙස් දෙන මේ පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දැන්වීමක් ; සහ

(ආ) ජනතාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව සඳහන් කරන දැන්වීමක් ඡන්ද පොළෙන් පිටත

ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම විය යුතු ය.

14. සෑම ඡන්ද පෙට්ටියක් ම, එය තුළට ඡන්ද පත්‍රිකා දැමිය හැකි ලෙස ද, පෙට්ටිය විවෘත නොකොට එයින් ඡන්ද පත්‍රිකා ඉවතට ගත නොහැකි ලෙස ද තැනිය යුතු ය. ඡන්ද පෙට්ටි.

15. (1) සෑම ජනමතවිචාරණයක දී ම ඡන්ද පත්‍රිකා මගින් ඡන්දය දෙනු ලැබිය යුතු ය. එක් එක් ඡන්දදායකයාගේ ඡන්දය, මෙහි මින් මතු නියම කරනු ලබන ආකෘතියෙහි වූ ඡන්ද පත්‍රිකාවකින් සමන්විත විය යුතු අතර, එහි, එසේ නියම කරනු ලබන විස්තර ද ඇතුළත් විය යුතු ය. ඡන්ද පත්‍රිකා.

(2) සෑම ඡන්ද පත්‍රිකාවක් ම, මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු අතර—

(අ) 2 (2) (අ) වගන්තිය ප්‍රකාර ජනාධිපතිවරයා විසින් නියමිත පරිදි ඡන්දදායකයන් වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රශ්නය එහි මුද්‍රණය කොට තිබිය යුතු ය. තවද "ලාම්පුව" සංකේතය සමග "ඔව්" යන වචනය සහ "කළය" සංකේතය සමග "නැත" යන වචනය, ඒ ප්‍රශ්නය අයිනේ එකක් අනෙකට පහළින් වූ වෙන ම කොටු දෙකක මුද්‍රණය කොට තිබිය යුතු ය;

(ආ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවක් ම නැමීමට හැකි විය යුතු ය;

(ආ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවකම පිට පැත්තේ අංකයක් මුද්‍රණය කොට තිබිය යුතු ය;

(ඇ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවකට ම එම අංකය ම මුහුණතෙහි මුද්‍රණය කොට ඇති උපපත්‍රිකාවක් අමුණා තිබිය යුතු ය.

ඡන්දය විමසීමේ කාලය.

16. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මඟින් කොමසාරිස්වරයා විසින් වෙනත් යම් වේලාවක් නියම කරනු ලැබුවහොත් මිස, ජනමතවිචාරණයේ ඡන්ද විමසීම 2(2) (ආ) වගන්තිය යටතේ නියම කරන ලද දිනයේ පෙරවරු සතට ආරම්භ කළ යුතු අතර, එදින පස්වරු හතරට අවසන් කළ යුතු ය.

ඡන්ද නිරීක්ෂකයන් පත් කිරීම.

17. (1) ඡන්දය විමසීම පවත්වනු ලබන අතරතුර යම් ඡන්ද පොළක් සඳහා වූ යම් ඡන්ද නිරීක්ෂකයකුගේ පත්වීම අවලංගු කිරීමට ඇති විය හැකි අවශ්‍යතාවය කෙරෙහි සැලකිලිමත්ව මැතිවරණ කොට්ඨාසයක් සඳහා පත් කරන ලද ජනමතවිචාරණ නියෝජිතයකු විසින් එක් එක් ඡන්ද පොළ සඳහා ඡන්ද නිරීක්ෂකයන් සාධාරණ සංඛ්‍යාවක් පත් කළ හැකි ය. පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් දක්වමින් එවැනි සෑම පත්වීමක් ම පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක්, ඒ නියෝජිතයා විසින් ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර හෝ ඡන්දය විමසන කාලය අතරතුර හෝ ඒ ඡන්ද පොළෙහි දී ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත දිය යුතු ය.

(2) ජනමතවිචාරණ නියෝජිතයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ තමා වෙත පවරා ඇති බලතල යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි ය. එසේ වුව ද එක් එක් ඡන්ද ප්‍රදේශයක් සම්බන්ධයෙන් එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවකට ඒ බලතල නොපැවරිය යුතු ය. මේ උපවගන්තිය යටතේ යම් බලතල පැවරීමක් ඡන්දය විමසීම පවත්වන දිනයට පෙර දින හතකට වඩා පසු නොවී තේරීම් භාර නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) ඒ නියෝජිතයා හෝ, (2) වන උපවගන්තිය යටතේ බලය පවරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා හෝ විසින් යම් ඡන්ද පොළක ක්‍රියා කිරීමට පත් කරන ලද යම් ඡන්ද නිරීක්ෂකයකුගේ නම ඡන්ද ස්ථානාධිපතිවරයාට දැනුම් දීමෙන් පසු, ඒ ඡන්ද නිරීක්ෂකගේ පත්වීම අවලංගු කොට, ඒ ඡන්ද පොළට වෙනත් නිරීක්ෂකයකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියෝජිතයා හෝ ඒ තැනැත්තා විසින්, ඒ පත්වීම අවලංගු කිරීම සහ ඒ ඡන්ද පොළට පත් කරන ලද අලුත් ඡන්ද නිරීක්ෂකයාගේ නම සහ ලිපිනය ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක ඡන්ද නිරීක්ෂකයන් දෙදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් කවර හෝ වේලාවක දී යම් ඡන්ද පොළකට ඇතුළු කර නොගත යුතු අතර, එසේ දෙදෙනකුට වැඩි සංඛ්‍යාවකට ඡන්ද පොළෙහි රැඳී සිටීමට ද ඉඩ නොදිය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙන් හෝ (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි තම ගේ නම ඡන්ද ස්ථානාධිපතිවරයාට දැනුම් දෙනු නොලැබූ කිසිම ඡන්ද නිරීක්ෂකයකු ඡන්ද පොළකට ඇතුළු කර ගනු නොලැබිය යුතු ය.

ඡන්ද විමසීම පවත්වා ගෙන යාම පිළිබඳ සාමාන්‍ය කාර්ය පටිපාටිය.

18. (1) යම් තැනැත්තකු අයත් වන්නේ යම් ඡන්දදායක කණ්ඩායමකට ද ඒ ඡන්දදායක කණ්ඩායම සඳහා වෙන් කර ඇති ඡන්ද පොළෙහි දී හැර වෙනත් කිසිම ඡන්ද පොළක දී ඒ තැනැත්තා ඡන්දය දීම පිණිස ඇතුළු කරගනු නොලැබිය යුතු ය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම ඡන්ද පොළෙහි මනා පැවැත්ම රැක ගත යුතු අතර, වරකට ඇතුළු කළ යුතු ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව ඔහු විසින් විධිමත් කළ යුතු ය. තව ද ඔහු විසින් ඡන්ද නිරීක්ෂකයන්, රාජකාරියෙහි නියුක්ත පොලිස් නිලධරයන් සහ නිල වශයෙන් ඡන්ද පොළෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබූ වෙනත් තැනැත්තන් හැර සෙසු සියලු තැනැත්තන් ඡන්ද පොළෙන් බැහැර කළ යුතු ය.

(3) යම් තැනැත්තකු ඡන්ද පොළෙහි දී නොමනා ලෙස හැසුරුන හොත් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නීත්‍යානුකූල අණට කීකරු වීම පැහැර හැරියහොත් ඒ තැනැත්තා යම් පොලිස් නිලධරයකු ලවා හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හෝ තෝරීම් භාර නිල ධරයා විසින් ලිඛිතව බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු ලවා හෝ ඡන්ද පොළෙන් වහාම ඉවත් කරනු ලැබීමට ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සැලැස්විය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඡන්ද පොළකින් ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකුට—

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අවසරය ඇතිව හැර, ඡන්ද විමසීම පැවැත්වෙන වේලාව ඇතුළත ඡන්ද පොළට යළිත් ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ ඡන්ද පොළෙහි දී යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා නගා ඇත් නම්, ඔහු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරි යට පමුණුවනු තෙක් ඒ තැනැත්තා අත් අඩංගුවේ තබා ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් ඡන්ද පොළක දී ඡන්දය දීමට අන්‍යාකාරයකින් හිමිකම ඇති යම් ඡන්දදායකයකුට ඒ ඡන්ද පොළෙහි දී ඡන්දය දීමේ අවස්ථාවක් ලැබීමෙන් වැළැක්වෙන පරිදි මේ උපවගන්ති යෙන් පවරන ලද බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

ඡන්ද පෙට්ටිවලට මුද්‍රා තැබීම සහ ඡන්ද විමසීම ආරම්භ කිරීම.

19. (1) ඡන්දය විමසීම ආරම්භ කිරීමට පෙරාතුව ම ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්,—

(අ) ඡන්දය විමසීමේ දී පාවිච්චි කරනු ලබන ඡන්ද පත්‍රිකා, නිල මුද්‍රාව, නිල ලකුණ සහ ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයේ කොටස්වල පිටපත්, ඒ ඡන්ද පොළට පැමිණ සිටින යම් තැනැත්තන් වෙතොත්, ඒ තැනැත්තන්ට පෙන්විය යුතු ය ; තව ද

(ආ) පාවිච්චි කිරීමට ඇති එක් එක් ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව බලාගත හැකි වන සේ ඉහත කී තැනැත්තන්ට ඡන්දය විමසීම ආරම්භයේ දී ම එය හිස්ව පෙන්විය යුතු ය. ඉක්බිතිව ඊට යතුරු ලා මුද්‍රා නොතබා, එය විවෘත කිරීම වැළැක්වෙන ආකාරයට ඒ මත ස්වකීය මුද්‍රාව තබා ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා එය තමාට පෙනෙන ස්ථානයක තැබිය යුතු ය. තව ද යතුරු ලා මුද්‍රා තැබූ පරිදි ම එය තබා ගත යුතු ය.

මේ පනතින් නියමිත වේලාවට ඡන්ද විමසීම ආරම්භ වීම තහවුරු වන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම වෙත මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන මගින් නියම වී ඇති කාර්ය ඉටු කළ යුතු ය.

(2) ඡන්ද විමසීම ආරම්භ කිරීමෙන් පසු පාවිච්චි කළ යුතු සෑම ඡන්ද පෙට්ටියක් සම්බන්ධයෙන් ම (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම.

20. (1) එක් එක් ඡන්දදායකයා වෙත එක් ඡන්ද පත්‍රිකාවක් දිය යුතු අතර, ඔහුට එක් ඡන්දයක් තිබිය යුතු ය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් නැතහොත් ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාර දෙනු ලැබිය යුතු ය. ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාර දීමට පෙරාතුව ම—

(අ) ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්දදායකයාගේ අංකය, නම සහ විස්තරය හඬ නගා කියවිය යුතු ය ;

(ආ) ඡන්දදායකයාගේ අංකය උපපත්‍රිකාවෙහි ලකුණු කොට ඡන්ද පත්‍රිකාව එයින් වෙන් කළ යුතු ය ;

(ඇ) ඡන්ද පත්‍රිකාව නිල ලකුණින් මුද්‍රා තැබිය යුතු ය ; නැත හොත් නිල ලකුණ එහි තෙරපිය යුතු ය ; නැතහොත් නිල ලකුණ එහි සිදුරු කළ යුතු ය ; තව ද

(ඈ) ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාවක් ලබා ඇති බව දැක්වීම පිණිස, එහෙත් ඔහු ලැබූ නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක් දැයි නොදක්වා නාම ලේඛනයෙහි ඔහුගේ අංකය ඉදිරියෙන් ලකුණක් තැබිය යුතු ය.

ඡන්දදායකයා පරීක්ෂා කිරීම සහ උචිත ලකුණ සලකුණු කිරීම.

21. (1) ජනමතවිචාරණයක දී යම් ඡන්දදායකයකු විසින්—

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකුට උචිත පරීක්ෂණය කිරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, හෝ

(ආ) එසේ පරීක්ෂණයට ඉඩ දීමෙන් පසු ඒ ඡන්දදායකයා ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව අනාවරණය වන්නේ නම් ; හෝ

(ඇ) එසේ පරීක්ෂණයට ඉඩ දීමෙන් පසු ඒ ඡන්දදායකයා ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කර නොමැති බව අනාවරණය වුව ද ඒ ඡන්දදායකයා උචිත ලකුණින් තමා සලකුණු කරනු ලැබීමට ඒ නිලධරයාට හෝ තැනැත්තාට ඉඩ දීම ප්‍රතික්ෂේප කරතහොත්

ඒ ඡන්දදායකයාට කිසිම ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නො ලැබිය යුතු අතර, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ ඡන්දදායකයා ඒ ජනමතවිචාරණයේ දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද පොළක දී ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නොලැබූ එක් එක් ඡන්දදායකයාට අදාළ පහත දැක්වෙන විස්තර ඒ ඡන්ද පොළ භාර ඡන්ද ස්ථානාධිපති වරයා විසින් මේ පනතේ තුන්වන උපලේඛනයෙහි "ආ" ආකෘති යට සාරානුකූල වූ ලැයිස්තුවක ඇතුළත් කළ යුතු ය:—

(අ) ඡන්ද හිමි නාම ලේඛනයේ ඒ ඡන්දදායකයාගේ අංකය;

(ආ) ඒ ලේඛනයෙහි දැක්වෙන පරිදි ඒ ඡන්දදායකයාගේ නම; සහ

(ඇ) ඒ ඡන්දදායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නො ලැබූ හේතුව.

ඒ නාමාවලිය "21 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා නිකුත් කරනු නොලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව" යනුවෙන් මේ පනතෙහි හඳුන්වනු ලැබේ.

(3) මේ වගන්තියෙහි—

(අ) "උචිත ලකුණ" යන යෙදුමෙන් නොමැකිය හැකි තින්තෙන් කරන ලද ලකුණක් අදහස් වේ;

(ආ) ඡන්දදායකයකු පරීක්ෂා කිරීම හෝ සලකුණු කිරීම හා සම්බන්ධ හෝ ඊට අදාළ යම් පද සම්බන්ධයක දී "උචිත" යන පාඨයෙන්—

(i) ඒ ඡන්දදායකයාගේ වම් අතේ සුලැඟිල්ල හෝ ඒ සුලැඟිල්ල නොමැති නම්, ඔහුගේ වම් අතේ වෙනත් යම් ඇඟිල්ලක්; හෝ

(ii) ඔහුගේ වම් අතේ ඇඟිලි සියල්ල ම නොමැති නම්, ඔහුගේ දකුණු අතේ සුලැඟිල්ල හෝ ඒ සුලැඟිල්ල නොමැති නම්, ඔහුගේ දකුණු අතේ වෙනත් යම් ඇඟිල්ලක්; හෝ

(iii) ඔහුගේ වම් හා දකුණු අත්වල ඇඟිලි සියල්ල ම නො මැති නම්, ඔහුගේ වම් හෝ දකුණු අතෙහි කෙළවර

අදහස් වේ.

ඡන්දය දෙන ආකාරය.

22. (1) ඡන්ද පත්‍රිකාව ලැබුණු විට, ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ ඒ නිලධරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් පෙන්වා දෙනු ලබන ආවෘත ස්ථානයකට ඡන්දදායකයා වහාම යා යුතු අතර, මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඡන්දදායකයන්ට මග පෙන්වීම සඳහා දී ඇති උපදෙස්වලට හැකිතාක් දුරට අනුකූලව, ඡන්ද පත්‍රිකාව එහිදී රහසින් ලකුණු කොට, තම ඡන්දය නොපෙනෙන සේ ඡන්ද පත්‍රිකාව නමා, නිල ලකුණ පෙනෙන සේ පත්‍රිකාවේ පිටුපස ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙන්වා, එසේ නමන ලද ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයා ඉදිරියේ දී ඡන්ද පෙට්ටිය තුළට බහාලිය යුතු ය.

(2) ඡන්ද පත්‍රිකා ලකුණු කිරීම සඳහා වෙන් කරන ලද යම් ස්ථානයක කිසිම ඡන්දදායකයකු නුවුවමනා ලෙස ප්‍රමාද නොවන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය යම් පියවර, ඡන්දය පවත්නා අතරතුර කවර හෝ වේලාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ගනු ලැබිය හැකි ය.

ඡන්දය දීමට හැකිවීම පිණිස ඡන්දදායකයන්ට සහායවීම.

23. (1) යම් ඡන්දදායකයකු විසින් ඉල්ලා සිටි විටක, ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් සුදුසු යයි අදහස් කරන්නේ නම්, ඡන්ද නිරීක්ෂකයන් පැමිණ සිටියහොත්, ඔවුන්ට පෙනෙන සහ ඇසෙන පරිදි, මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් උපදෙස්වල දක්වා ඇති ඡන්දය දීමේ ක්‍රමය ඔහු විසින් ඡන්දදායකයාට පහදා දිය හැකි ය. එහෙත් එසේ කිරීමේ දී ඡන්ද පත්‍රිකාවෙහි සඳහන් යෝජනාවට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ මග පෙන්වීමක් වශයෙන් ඡන්දදායකයා විසින් තේරුම් ගනු ලැබිය හැකි යම් ක්‍රියාවක් කිරීමෙන් ඔහු තරයේ වැළකිය යුතු ය.

(2) අන්ධභාවය හෝ වෙනත් ශාරීරික හේතුවක් නිසා මේ පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූලව ඡන්දය දීමට අපොහොසත් වන යම් ඡන්දදායකයකු විසින් ඉල්ලා සිටි විටක, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොළෙහි තම කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඔහු විසින් නියම කරනු ලබන ආකාරයකින් ලකුණු කළ යුතු අතර, ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට සැලැස්විය යුතු ය.

ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීම තහනම් බව.

24. ජනමතවිචාරණයක දී ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීමට කිසිම ඡන්දදායකයකු හිමිකම් නොලැබිය යුතු ය.

25. මේ පනත යටතේ ජනමතවිචාරණයක දී යම් තැනැත්තකු

(අ) මැතිවරණ කොට්ඨාස එකකට වඩා වැඩි ගණනක දී ඡන්දය දෙතොත් හෝ එසේ ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත් ; හෝ

(ආ) එකම මැතිවරණ කොට්ඨාසයක දී එක් වරකට වැඩි වාර ගණනක් ඡන්දය දුනහොත් හෝ එසේ ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත්

ඔහු නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

ඔහු ඡන්ද දීම නීති විරෝධී ක්‍රියාවක් බව.

26. (1) යම් ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් ස්වකීය අභිමතය පරිදි ද, ඡන්ද නිරීක්ෂකයකු විසින් ඉල්ලා සිටිය හොත් එවිට ද, යම් ඡන්දදායකයකුට ඡන්ද පත්‍රිකාවක් දීමට පෙර, මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති "ඇ", "ඈ", "ඉ" සහ "ඊ" ආකෘතිවල සඳහන් ප්‍රකාශ සියල්ලම හෝ ඉන් යම් ප්‍රකාශයක් කර ඒවා හෝ එය පිළිගෙන අත්සන් කරන ලෙස ඡන්දදායකයාට නියම් කළ හැකි ය. ඒ සෑම ප්‍රකාශයක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

ප්‍රකාශ කරන ලෙස ඡන්ද දායකයකුට නියම කිරීමට ඇති බලය.

(2) එවැනි යම් ප්‍රකාශයක් කිරීමට යම් තැනැත්තකු ප්‍රතික්ෂේප කළහොත්, ඔහුට ඡන්ද පත්‍රිකාවක් දීම ඡන්ද ස්ථානාධිපති වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් එවැනි යම් ප්‍රකාශයක ඕනෑ කමින් ම අසත්‍ය ප්‍රකාශයක් කළහොත්, ඔහු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සිය යක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක කාලයක් නොඉක්ම වන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනා ගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

27. ස්වකීය ඡන්ද පත්‍රිකාව ඡන්ද පත්‍රිකාවක් ලෙස නිසියාකාරව පාවිච්චි කළ නොහැකි වන සේ එය අනවධානයෙන් පරිහරණය කර ඇති ඡන්දදායකයකු විසින්, එසේ අනවධානයෙන් පරිහරණය කළ ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දී ඡන්ද ස්ථානාධිපතිවරයා සෑහීමට පත්වන පරිදි ඒ අනවධානය පිළිබඳ සිද්ධිය ඔප්පු කරනු ලැබූ කල්හි, ඔහු විසින් එසේ භාර දෙන ලද (මේ පනතෙහි "නරක් වූ ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද පත්‍රිකාව වෙනුවට වෙනත් ඡන්ද පත්‍රිකාවක් ලබා ගත හැකි අතර, නරක් වූ ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපති වරයා විසින් වහාම අවලංගු කළ යුතු ය.

නරක් වූ ඡන්ද පත්‍රිකා.

28. ඡන්දහිමි නාම ලේඛනයෙහි නම සඳහන් එක්තරා ඡන්ද හිමි යකු ලෙස පෙනී සිටින තැනැත්තකු, ඒ ඡන්ද හිමියා ලෙස වෙනත් තැනැත්තකු ඡන්දය දීමෙන් පසු ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටිය හොත්, ඉල්ලුම්කරු විසින්, මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු වූ ද මේ පනතේ තුන්වන උපලේඛනයෙහි "උ" ආකෘතියට සරානුකූල

ද්විත්ව ඡන්ද.

වූ ද ප්‍රකාශයක් කොට, එය පිළිගෙන අත්සන් කළ විට, ඡන්ද පත්‍රිකාවක් ලැබීමට සහ වෙනත් යම් ඡන්දදායකයකු ඡන්දය දෙන ආකාරයෙන්ම ඡන්දය දීමට ද ඒ ඉල්ලුම්කරු හිමිකම් ලැබිය යුතු ය. එසේ වුවත් මේ පනතෙහි “ද්විත්ව ඡන්ද පත්‍රිකාවක්” යනුවෙන් සඳහන් කරනු ලබන ඒ ඡන්ද පත්‍රිකාව අනෙක් ඡන්ද පත්‍රිකාවලින් වෙනස් වූ වර්ණයකින් යුක්ත විය යුතු අතර, ඡන්ද පෙට්ටිය තුළ බහාලීමට පෙර ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්දදායකයාගේ නම සහ ලේඛනයෙහි වූ ඔහුගේ අංකය එහි පිටපත් කළ යුතු ය. තව ද ඒ අංකය මේ පනතේ තුන්වන උපලේඛනයේ “ඌ” ආකෘතියට සාරානුකූල විය යුතු “ද්විත්ව ඡන්ද ලැයිස්තුව” යනුවෙන් හැඳින්වෙන ලැයිස්තුවක ඇතුළත් කළ යුතු ය. ද්විත්ව ඡන්ද පත්‍රිකා සම්බන්ධයෙන් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

ඡන්ද විමසීම අවසන් කිරීම.

29. ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා වූ නියමිත වේලාවෙන් පසු, ඡන්දදායකයකුට කිසිම ඡන්ද පත්‍රිකාවක් භාර දෙනු නො ලැබිය යුතු ය. එසේ වුවත් ඡන්ද පත්‍රිකාවක් භාරදෙනු ලැබූ යම් ඡන්ද දායකයකු ඉහත කී වේලාවේ දී යම් ඡන්ද පොළක් තුළ සිටිය හොත්, ඒ ඡන්දදායකයාට ඔහුගේ ඡන්දය සටහන් කිරීමට ඉඩ දිය යුතු ය.

ඡන්ද විමසීම අවසන් කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය.

30. (1) එක් එක් ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, ඡන්ද විමසීම අවසන් කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් ඡන්ද ස්ථාන නිරීක්ෂකයන් ඉදිරිපිට දී පහත සඳහන් දේ වෙන වෙනම පැකැට්ටුවලට දමා, ඒ පැකැට්ටුවලට තමාගේ මුද්‍රාව සහ ස්වකීය මුද්‍රා තැබීමට කැමති ඡන්ද ස්ථාන නිරීක්ෂකයන්ගේ ද මුද්‍රා තබා ඒ පැකැට්ටු ගණන් කිරීමේ නිලධරයාට භාර දිය යුතු ය :—

(අ) ඒ ඡන්ද පොළෙහි පාවිච්චි කරන ලද එක් එක් ඡන්ද පෙට්ටිය, ඒ එක් එක් පෙට්ටිය ඡන්ද විමසීම ආරම්භ කරනු ලැබූ වේලාවෙහි තිබුණු ආකාරයෙන් ම යතුරු දමා තිබිය යුතු අතර, ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමෙන් පසු යම් ඡන්ද පත්‍රිකා එහි බහාලිය නොහැකි වන සේ එය මුද්‍රා තබා තිබිය යුතු ය ;

(ආ) එක් එක් ඡන්ද පෙට්ටියේ යතුර ;

(ඇ) ගොනු කොට ගත්, පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා ;

(ඈ) ඡන්ද හිමි නාම ලේඛනයේ ලකුණු කළ පිටපත් සහ ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා ;

(ඉ) 21 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා නිකුත් කරනු නොලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව ; සහ

(ඊ) ද්විත්ව ඡන්ද ලැයිස්තුව.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දෙන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව දැක්වෙන්නා වූ ද—

(අ) නරක් වූ ඡන්ද පත්‍රිකා හැර, ඡන්දදායකයන් වෙත නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ආ) නරක් වූ ඡන්ද පත්‍රිකා ; සහ

(ඇ) පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා

යන ශීර්ෂ යටතේ ඒ පිළිබඳ ගණන් පෙන්වන්නා වූ ද මේ පනතේ තුන්වන උපලේඛනයෙහි "එ" ආකෘතියට සාරානුකූල වූ ද (මෙහි මින් මතු "ඡන්ද පත්‍රිකා විස්තරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රකාශයක් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සකස් කොට, පැකැට්ටු සමග භාර දිය යුතු ය.

## III වන කොටස

### ගණන් කිරීම

31. (1) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එක් එක් තේරීම් භාර නිලධරයා විසින්, එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයකු ද ඒ ගණන් කිරීමේ නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහායවීම පිණිස අවශ්‍ය සහයකයන් සහ ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් ඒ පත්වීම් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය. ගණන් කිරීමේ නිලධරයෝ.

(2) සුදුසු යයි තමා සිතන්නේ නම්, ගණන් කිරීමේ නිලධරයකුගේ කාර්ය, තේරීම් භාර නිලධරයකු විසින් ඉටු කරනු ලැබිය හැකි අතර, ගණන් කිරීමේ නිලධරයකු සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන ඒ තේරීම් භාර නිලධරයාට අදාළ විය යුතු ය.

32. ඡන්ද විමසීම අවසන් කළ පසු, හැකි ඉක්මණින් ඡන්ද ගණන් කිරීම සඳහා තේරීම් භාර නිලධරයා විසින් කටයුතු පිළියෙල කළ යුතු අතර, එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම හා ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වේලාව පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ද ගණන් කිරීමේ මධ්‍යස්ථානය සහ ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට වෙන් කරන ලද ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් දැක්වෙන ප්‍රකාශයක් ද එක් එක් ජනමතවිචාරණ නියෝජිතයා වෙත තේරීම් භාර නිලධරයා විසින් දෙනු ලැබිය යුතු ය. ගණන් කිරීම පිළිබඳ දැන්වීම.

33. (1) එක් එක් ජනමතවිචාරණ නියෝජිතයකු විසින් හෝ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් නානාත්තකු විසින් හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කරන විට පැමිණ සිටීම සඳහා (මෙහි මින් මතු "ගණන් කිරීමේ නිරීක්ෂකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නිරීක්ෂකයන් දෙදෙනකුට නොවැඩි ගණනක් පත්කරනු ලැබිය හැකි ය. ගණන් කිරීමේ නිරීක්ෂකයන් පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ප්‍රකාශ කරන ලියවිල්ලකින් වූ දැන්වීමක් ඡන්ද ගණන් කිරීම ආරම්භ වීමට පෙර, ජනමතවිචාරණ නියෝජිතයා විසින් හෝ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් තැනැත්තා විසින් හෝ ගණන් කිරීමේ නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය. නම හා ලිපිනය දී නොමැති යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකු ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීමට, ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ගණන් කිරීම.

34. (1) 32 වන වගන්තිය යටතේ තමාගේ ගණන් කිරීමේ මධ්‍යස්ථානය වෙත වෙන් කරන ලද සෑම ඡන්ද පොළකින්ම ඡන්ද පෙට්ටි තමා වෙත ලැබුණු පසු, ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලැබිය යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ඔහු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, පැමිණ සිටින ගණන් කිරීමේ නිරීක්ෂකයන් ඉදිරිපිට දී—

(අ) ඡන්ද පත්‍රිකා විස්තරය ඒ ගණන් කිරීමේ නිරීක්ෂකයන්ට පෙන්විය යුතු අතර, එහි පිටපත් ගැනීමට ඔවුන්ට අවසර දිය යුතු ය, තව ද

(ආ) එක් එක් ඡන්ද පෙට්ටිය විවෘත කොට, එහි ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගනු ලැබීමෙන් පසු, ඒ එක් එක් පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණන් කොට, වාර්තාගත කර ගෙන ඡන්ද පෙට්ටිවල තිබුණු ඡන්ද පත්‍රිකා සියල්ලම එකට මිශ්‍ර කළ යුතු ය.

(3) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කරන විට, ඡන්ද පත්‍රිකා මුහුණත උඩුකුරුව සිටින සේ තැබිය යුතු අතර, ඒ පත්‍රිකාවල පිටුපස මුද්‍රණය කොට ඇති අංක යම් තැනැත්තකු විසින් දැකීම වළක්වාලීම සඳහා නිසි සියලු පූර්වෝපායයන් යෙදිය යුතු ය.

(4) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම හැකි තාක් දුරට අඛණ්ඩව කරගෙන යා යුතු අතර, අවලංගු යයි ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි යම් ඡන්ද පත්‍රිකාවක "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන පිටසන් කළ යුතු ය.

(5) ගණන් කිරීමේ නිලධරයා විසින් ද්විත්ව ඡන්ද පත්‍රිකා ගණන් කරනු නොලැබිය යුතු අතර, දී ඇති පිළිතුර අනුව ඒවා වෙන වෙනම පැකැට්ටුවල බහාලිය යුතු ය.

(6) ඡන්ද ගණන් කරන අවස්ථාවේ දී ගණන් කිරීමේ නිලධරයාට, ඔහුගේ සහායකයන්ට හා ලිපිකරුවන්ට සහ ගණන් කිරීමේ නිරීක්ෂකයන්ට පැමිණ සිටිය හැකි නමුත්, ගණන් කිරීමේ නිලධරයාගේ කැමැත්ත ඇතිව මිස, වෙනත් තැනැත්තකුට එහි පැමිණ සිටිය නොහැකි ය.

ප්‍රතික්ෂේප කළ යුතු ඡන්ද පත්‍රිකා.

35. (1) (අ) නිල ලකුණ නොමැති යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ආ) යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්ද සටහන් කර ඇති යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඇ) පිට පැත්තෙහි ඇති මුද්‍රිත අංකය හැර, ඡන්දදායකයා හඳුනා ගත හැකි යම් දෙයක් ලියන ලද හෝ ලකුණු කරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඈ) ලකුණු නොකරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඉ) අවිනිශ්චිතභාවය නිසා අවලංගු වන්නා වූ යම් ඡන්ද පත්‍රිකාවක්

ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. එවැනි යම් ඡන්ද පත්‍රිකාවක "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන ගණන් කිරීමේ නිලධරයා විසින් පිටසන් කළ යුතු ය.

(2) ඡන්ද පත්‍රිකාවක් මත යොදා ඇති යම් ලකුණකින් ඡන්දදායකයාගේ ඡන්දය යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව දීමේ චේතනාව පැහැදිලිව දැක්වෙන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඡන්දදායකයන්ගේ මග පෙන්වීම සඳහා මේ පනතේ විධිවිධාන යටතේ දී ඇති උපදෙස්වලට සෑම අන්දමකින් ම අනුකූලව ඡන්ද පත්‍රිකාව ලකුණු කොට නොතිබීමේ හේතුව නිසාම පමණක් ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ඡන්ද පත්‍රිකාව (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකාවක් ව්‍යාජ හෝ කූට ඡන්ද පත්‍රිකාවක් නොවන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, නිල ලකුණින් මුද්‍රා තබා හෝ සිදුරුකර නොතිබීමේ හේතුව නිසාම පමණක් ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය. මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප නොකිරීමට තීරණය කිරීමට පෙර, ගණන් කිරීමේ නිලධරයා විසින්, ගණන් කිරීමේ නිරීක්ෂකයා පැමිණ සිටින්නේ නම්, එක් එක් ගණන් කිරීමේ නිරීක්ෂකයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස්වලට සවන් දිය යුතු ය.

(4) ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට පෙර, ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකාවේ පිටුපස මුද්‍රණය කොට ඇති අංකය යම් තැනැත්තකු විසින් දැකීම වළක්වාලීම සඳහා නිසි සියලු පූර්වෝපායයන් යොදා, ගණන් කිරීමේ නිරීක්ෂකයන් පැමිණ සිටින්නේ නම්, ඒ එක් එක් ගණන් කිරීමේ නිරීක්ෂකයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස්වලට සවන් දිය යුතු ය.

(5) ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ඔහු විසින් ගණන් කරනු නොලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් හේතුව යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව වෙන වෙනම දැක්වෙන ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙළ කරනු ලැබිය යුතු අතර, යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකුගේ ඉල්ලීම පිට, ඒ ප්‍රකාශය පිටපත් කර ගැනීමට ඔහුට ඉඩ දිය යුතු ය.

(7) යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව දුන් ඡන්ද සංඛ්‍යාව පිළිබඳව වචනයෙන් මෙන්ම ඉලක්කමෙන් දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය. තව ද ඔහුගේ සහායකයන් හෝ ලිපිකරුවන් අතුරින් එක් කෙනකු විසින් ද පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමැත්තක් දක්වන යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකු විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකුගේ ඉල්ලීම පිට ඒ ප්‍රකාශය පිටපත් කර ගැනීමට ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ නිරීක්ෂකයාට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(8) ගණන් කිරීමේ නිලධරයා විසින් (7) වන උපවගන්තියෙහි සඳහන් ලිඛිත ප්‍රකාශයක් පිළියෙල කිරීමට පෙර, අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන නැවත ගණන් කිරීම් යම් සංඛ්‍යාවක් ඔහු විසින් කරනු ලැබිය හැකි ය; ගණන් කිරීමේ නිරීක්ෂකයකුගේ ඉල්ලීම පිට නැවත ගණන් කිරීමක් හෝ නැවත ගණන් කිරීම් කළ යුතු ය. එසේ වුව ද, යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකුගේ හෝ ගණන් කිරීමේ නිරීක්ෂකයන් සියල්ලන්ගේ ම ඉල්ලීම පිට එසේ කළ යුතු උපරිම නැවත ගණන් කිරීම් සංඛ්‍යාව දෙකක් නො ඉක්ම විය යුතු ය.

(9) යම් ඡන්ද පත්‍රිකාවක් සම්බන්ධයෙන් උද්ගත වන යම් ප්‍රශ්නයක් පිළිබඳව ගණන් කිරීමේ නිලධරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

**34 වන හා 35 වන වගන්ති යටතේ වූ බලතල, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් අදාළ විශේෂ විධිවිධාන.**

36. 34 වන වගන්තිය හෝ 35 වන වගන්තිය යටතේ ගණන් කිරීමේ නිලධරයකු සතු යම් බලතල, කාර්යයක් හෝ කර්තව්‍යයක් ඒ නිලධරයාගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ ක්‍රියා කරන ඔහුගේ සහායකයන්ගෙන් හෝ ලිපිකරුවන්ගෙන් යම් කෙනකු විසින්, ඒ නිලධරයා සඳහා සහ ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

**ගණන් කිරීම අවසන් කිරීම.**

37. යම් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ගණන් කිරීම සම්පූර්ණ කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින්—

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා;

(ඇ) ද්විත්ව ඡන්ද පත්‍රිකා;

(ඈ) ඡන්ද පත්‍රිකා ගිණුම;

(ඉ) 30 (1) වන වගන්තියේ (ඇ) සිට (ඊ) තෙක් වූ ඡේදවල සඳහන් පැකැට්ටු;

(ඊ) 34 වන වගන්තියේ (2) (ආ) උපවගන්තිය යටතේ වූ ගණන් කිරීම පිළිබඳ වාර්තාව;

(උ) 35 (6) වන වගන්තිය යටතේ වූ ප්‍රකාශය; සහ

(ඌ) යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව පිළිබඳව 35(7) වන වගන්තිය යටතේ වූ ලිඛිත ප්‍රකාශය,

මුද්‍රා තැබූ පැකැට්ටුවල බහා තේරීම් භාර නිලධරයා වෙත නොපමාව භාර දෙනු ලැබිය යුතු ය.

38. මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවලට අනුකූලව තේරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනම ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී හෝ මධ්‍යස්ථාන ගණනක දී තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.

39. (1) 37 වන වගන්තියේ සඳහන් ලේඛන ලැබුණු පසු, තේරීම් භාර නිලධරයා විසින්, (තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබූ ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ගණන් කිරීමේ නිලධරයන් ද ඇතුළුව) සියලුම ගණන් කිරීමේ නිලධරයන් විසින් 35 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තමා වෙත සපයන ලද ප්‍රකාශවලින්—

තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශය පිළියෙල කළ යුතු බව.

(අ) යෝජනාවට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව;

(ආ) යෝජනාවට විපක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව;

(ඇ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සංඛ්‍යාව; සහ

(ඈ) ඡන්ද හිමි නාම ලේඛනයේ ඡන්ද හිමියන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව

පෙන්නුම් කෙරෙන මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් වූ වාර්තාවක් තේරීම් භාර නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. ඒ වාර්තාව ඔහුගේ සහායකයන් අතුරින් කෙනකු විසින් ද පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමැත්තක් දක්වන යම් ජනමත විචාරණ නියෝජිතයකු විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය. යම් ජනමතවිචාරණ නියෝජිතයකුගේ ඉල්ලීම පිට, ඒ වාර්තාව පිටපත් කර ගැනීමට තේරීම් භාර නිලධරයා විසින් ඒ නියෝජිතයාට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(2) ජනමතවිචාරණ නියෝජිතයාට හා ඒ ජනමතවිචාරණ නියෝජිතයා විසින් ලියවිල්ලකින් පත් කරන ලද වෙනත් එක් තැනැත්තකුට (1) වන උපවගන්තිය යටතේ වූ කටයුතුවලදී පැමිණ සිටීමට තේරීම් භාර නිලධරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තේරීම් භාර නිලධරයා විසින් පිළියෙල කරන ලද වාර්තාව, ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා වෙත ඔහු විසින් නොපමාව යවනු ලැබිය යුතු ය.

40. (1) ජනරජයේ සියලුම තේරීම් භාර නිලධරයන්ගෙන් 39(3) වන වගන්තියේ සඳහන් වාර්තාව ලැබීමෙන් පසුව, ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා විසින්—

ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා විසින් වාර්තාවක් පිළියෙල කළ යුතු බව.

(අ) යෝජනාවට පක්ෂව දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව;

(ආ) යෝජනාවට විපක්ෂව දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව;

(ඇ) ප්‍රතික්ෂේප කරනු ලැබූ ඡන්ද සංඛ්‍යාව; සහ

(ඈ) සියලුම ඡන්ද හිමි නාම ලේඛනවල මුළු ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව

පෙන්නුම් කෙරෙන මුළු ජනරජය සම්බන්ධයෙන් වූ වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයා විසින් පිළියෙල කරන ලද වාර්තාව ඔහු විසින් කොමසාරිස්වරයා වෙත යවනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව ලැබුණු පසු කොමසාරිස්වරයා විසින්, එය නොපමාව ජනාධිපතිවරයා වෙත යැවිය යුතු ය.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

41. 40 වන වගන්තියෙහි සඳහන් වාර්තාව ලැබුණු විට, ජනාධිපතිවරයා විසින් ඒ වාර්තාව ගැසට් පත්‍රයෙහි පළ කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

ඡන්ද පත්‍රිකා ආදිය බැහැර කිරීම.

42. 37 වන වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද පැකැට්ටු සහ සියලුම ලේඛන, ඒවා ලැබුණු දින සිට ගණන් බලන ලද මාස තුනක කාලයක් තේරීම් භාර නිලධරයා විසින් තබාගත යුතු ය. ඉක්බිතිව, කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරතහොත් මිස, තේරීම් භාර නිලධරයා විසින් ඒ පැකැට්ටු සහ ලේඛන විනාශ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

## IV වන කොටස

## වැරදි

ඡන්ද පත්‍රිකා, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ආදිය සහ සම්බන්ධ වැරදි.

43. (අ) යම් ඡන්ද පත්‍රිකාවක් හෝ යම් ඡන්ද පත්‍රිකාවක වූ නිල ලකුණක් කූට ලෙස පිළියෙල කරන හෝ එහි ව්‍යාජ අනුකරණයක් කරන හෝ එය වංචනික ලෙස විනාශ කරන; හෝ

(ආ) නිසි බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකු වෙත සපයන; හෝ

(ඇ) යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් වන නැතහොත් යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුගෙන් මිල දී ගන්නා හෝ මිල දී ගැනීමට ඉදිරිපත් වන; හෝ

(ඈ) මේ පනත අනුව නිල ලකුණ යොදා ඇති යම් ඡන්ද පත්‍රිකාවක් තමා සන්තකයෙහි තබා ගැනීමට මේ පනත යටතේ හිමිකම් ලත් තැනැත්තකු නොවී සිටියදී එවැනි යම් ඡන්ද පත්‍රිකාවක් තමා සන්තකයෙහි තබා ගන්නා; හෝ

(ඉ) ඡන්ද පෙට්ටියක් තුළ බහාලීමට නීතියෙන් තමාට බලය පැවරී ඇති ඡන්ද පත්‍රිකාව නොවන වෙනත් දෙයක් යම් ඡන්ද පෙට්ටියක් තුළ බහාලන; හෝ

(ඊ) නිසි බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොළෙන් පිටතට ගෙන යන හෝ ඡන්ද පොළකින් පිටත දී යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයෙහි තබා ගෙන සිට හසුවන; හෝ

(උ) ජනමතවිචාරණයක කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කොට ඇති යම් ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පත්‍රිකා පැකැට්ටුවක් නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන, හෝ අන් ලෙසකින් ඊට යමක් කරන; හෝ

(ඌ) යම් ඡන්ද පත්‍රිකාවක් හෝ ජනමතවිචාරණයක දී ඡන්ද පත්‍රිකාවක් ලෙස සැලකෙන හෝ පාවිච්චි කළ හැකි කිසිවක් නිසි බලය නොමැතිව මුද්‍රණය කරන; හෝ

(එ) යම් ජනමතවිචාරණයක දී ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර ඡන්ද පෙට්ටියක් තුළට බහාලනු ලැබීමෙන් පසු ඡන්ද පත්‍රිකාවක් ඉවතට ගැනීමට, විකෘති කිරීමට හෝ වංචනික ලෙස වෙනස් කිරීමට උපයෝගී කර ගත හැකි යම් උපකරණයක්, සූත්‍රයක් හෝ යන්ත්‍රයක් ජනමතවිචාරණයක කාර්ය සඳහා සාදන, තනන, ජනරජයට ආනයනය කරන, තම සන්තකයෙහි තබා ගන්නා, සපයන හෝ පාවිච්චි කරන නැතහොත් යම් ජනමතවිචාරණයක කාර්ය සඳහා එය සෑදීමට, තැනීමට, ජනරජයට ආනයනය කිරීමට, සැපයීමට හෝ පාවිච්චි කිරීමට සලස්වන; හෝ

(ඒ) මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක හෝ මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායක නියෝග යටතේ තමා වෙත එවන ලද යම් ප්‍රකාශයක අසත්‍ය ප්‍රකාශයක් හිතාමතාම කරන; හෝ

(ඔ) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවල අර්ථානුකූල වූ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක් හෝ යම් අනන්‍යතා ප්‍රකාශයක් හෝ යම් ආවරණ ලියුම් කවරයක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන්‍යාකාරයකින් එයට අයුතු දෙයක් කරන නැතහොත් ඒවා යමක් කරන; හෝ

(ඕ) යම් ජනමතවිචාරණයක දී යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් හෝ යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් වශයෙන් සැලකෙන හෝ පාවිච්චි කළ හැකි කිසිවක් නිසි බලය නොමැතිව මුද්‍රණය කරන; හෝ

(ක) යම් ජනමතවිචාරණයක දී යම් ඡන්දදායකයකු සම්බන්ධයෙන් උචිත ලකුණ හෝ ඒ ලකුණ වශයෙන් සැලකෙන හෝ වරදවා තේරුම් ගනු ලැබිය හැකි කිසිවක් නිසි බලය නොමැතිව තබන; හෝ

(ග) යම් ජනමතවිචාරණයක දී යම් ඡන්දදායකයකු සම්බන්ධයෙන් තබන ලද උචිත ලකුණක් නිසි බලය නොමැතිව වංචනික ලෙස විරූප කරන; හෝ

(ච) ඡන්දය දීමට තමාට නීත්‍යනුකූලව නොහැකි බව හෝ ඡන්දය දීමට තමා නුසුදුස්සකුව සිටින බව දැන දැනම යම් ජනමතවිචාරණයක දී ඡන්දය දෙන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය. තව ද, වරදකරු කරනු ලැබීම හේතු කොටගෙන, වරදකරු කරනු ලැබූ දින සිට, අවුරුදු හතක කාලයක් සඳහා මේ පනත යටතේ වූ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීම හෝ යම් ජනමත විචාරණයක දී ඡන්දය දීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වීම හෝ කළ නොහැකි විය යුතු අතර, ඒ දිනයෙහි දී ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී සිටියහොත්, එසේ වරදකරු කරනු ලැබූ දින සිට, ඔහු තම තේරී පත්වීම අත්හළ යුතු ය.

ඡන්ද විමසීම් දිනයෙහි දී තහනම් කරන ලද ඇතැම් ක්‍රියා.

**44.** (1) ඡන්ද පොළක ඡන්ද විමසීම පවත්වනු ලබන යම් දිනයක, ඒ ඡන්ද පොළ සීමාව ඇතුළත හෝ ඒ ඡන්ද පොළට ඇතුළුවන ස්ථානයේ සිට කිලෝ මීටර් භාගයක දුරක් ඇතුළත හෝ කිසිම තැනැත්තකු විසින් පහත දැක්වෙන ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු ය :—

(අ) ඡන්ද ආයාචනය කිරීම ;

(ආ) යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ඉල්ලීම ;

(ඇ) යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය නොදෙන ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීම ;

(ඈ) ජනමතවිචාරණයක දී ඡන්දය නොදෙන ලෙස ඡන්ද හිමියකු පෙළඹවීම ;

(ඉ) ජනමතවිචාරණය හා සම්බන්ධ (යම් නිල අත්පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක් හෝ දැන්වීමක් නොවන) යම් අත්පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක් හෝ දැන්වීමක් හෝ 15 වන වගන්තියේ සඳහන් යම් ලකුණක් බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම.

මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් ඡන්ද පොළක ඡන්ද විමසීමක් පවත්වනු ලබන යම් දිනයක කිසිම තැනැත්තකු විසින් ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළට පැමිණෙන යම් තැනැත්තකුට කරදරයක් වන පරිදි හෝ ඡන්ද පොළෙහි රාජකාරියේ යෙදී සිටින නිලධරයන්ගේ යහ පැවතුම හෝ වෙනත් තැනැත්තන්ගේ වැඩට බාධා ඇති වන පරිදි—

(අ) ඡන්ද පොළක් ඇතුළත හෝ ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟ හෝ ඡන්ද පොළ අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයක දී යම් මෙගෆෝනයක් හෝ ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ මිනිස් කටහඬ විස්තා

රණය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම සඳහා වූ වෙනත් උපකරණයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියා කරවීම නොකළ යුත්තේ ය; නැතහොත්

(ආ) ඡන්ද පොළක් ඇතුළත හෝ ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟ හෝ ඡන්ද පොළ අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයක දී කෑගැසීම හෝ වෙනත් අන්දමකින් අසංවර ලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය.

මේ උපවගන්තියේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකිරීමක් වැළැක්වීම සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍ය විය හැකි පියවර ගැනීම හා යම් බලයක් පාවිච්චි කිරීම යම් පොලිස් නිලධරයකු විසින් කරනු ලැබිය හැකි අතර, ඒ විධිවිධාන කඩකිරීමෙහි ලා, පාවිච්චි කරන ලද යම් උපකරණයක් තහනමට ගැනීම ද ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

45. කිසිම තැනැත්තකු විසින්— පෙරහැර වල් පවත්වා ගෙන යාම, සීමා කිරීම.

(අ) ජනමතවිචාරණයක් සම්බන්ධයෙන් වූ ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීමේ දිනයෙන් ආරම්භව, ඒ ජනමතවිචාරණයේ දී ගන්නා ලද ඡන්ද විමසීමේ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත, යම් වේලාවක ඒ වර්ෂයේ මැයි මස 1 වන දින පවත්වනු ලබන පෙරහැරක් හෝ ආගමික හෝ සමාජීය කාර්ය සඳහා පවත්වනු ලබන යම් පෙරහැරක් හැර, වෙනත් යම් පෙරහැරක් පවත්වාගෙන යාම, පැවැත්වීම හෝ එයට සහභාගිවීම කරනු නොලැබිය යුතු ය; නැතහොත්

(ආ) (අ) ඡේදයේ සඳහන් කාලය ඇතුළත පවත්වනු ලබන හෝ මෙහෙයවනු ලබන යම් පෙරහැරක දී, එකී (අ) ඡේදයෙහි සඳහන් ජනමතවිචාරණයේ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් කිරීම අරමුණු කොටගත් යම් ක්‍රියාවක් හෝ දෙයක් කරනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ප්‍රසිද්ධ රැස්වීම් පටිබන්ධ කිරීම.

46. ඡන්ද විමසීම සඳහා නියම කරන ලද දිනයට පැය හතළිස් අටකට පෙර ආරම්භව, ජනමතවිචාරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් එක් සතියකට පසු අවසන් වන කාලය ඇතුළත කිසිම ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

43 වන, 44 වන, 45 වන සහ 46 වන වගන්ති යටතේ වූ වැරදිවලට අදාළ පොදු විධිවිධාන.

47. (1) 43 වන වගන්තියේ හෝ 44 වන වගන්තියේ හෝ 45 වන වගන්තියේ හෝ 46 වන වගන්තියේ සඳහන් වරදක් කිරීමට තැත්කරන සෑම තැනැත්තකු ම, ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(2) 43 වන වගන්තිය හෝ 44 වන වගන්තිය හෝ 45 වන වගන්තිය හෝ 46 වන වගන්තිය යටතේ වූ සෑම වරදක් ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් විය යුතු ය.

(3) ජනමතවිචාරණයක ඡන්ද පෙට්ටියකට, ඡන්ද පත්‍රිකාවකට හෝ ලකුණු කිරීමේ උපකරණයකට අදාළ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක දී, ඒ ඡන්ද පෙට්ටියෙහි, ඡන්ද පත්‍රිකාවෙහි, හෝ ලකුණු කිරීමේ උපකරණයෙහි අයිතිය මෙන්ම යම් ඡන්ද පත්‍රිකාවක උපපත්‍රිකාවේ අයිතිය ද ඒ ජනමතවිචාරණයේ තේරීම් භාර නිලධරයා වෙත පැවරී ඇතැයි සඳහන් කරනු ලැබිය හැකි ය.

(4) 43 වන වගන්තිය හෝ 44 වන වගන්තිය හෝ 45 වන වගන්තිය හෝ 46 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක්, නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

ජනමත විචාරණ ප්‍රකාශන මුද්‍රණය කිරීම ආදිය.

48. යම් ජනමතවිචාරණයක් ගැන සඳහන් කෙරෙන සහ මුද්‍රණ කරුගේ සහ ප්‍රකාශකගේ නම සහ ලිපිනය මුහුණතෙහි නොදැක්වෙන යම් ප්‍රචාරක දැන්වීමක්, අත්පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් මුද්‍රණය කරන, පළ කරන, බෙදා හරින හෝ අලවා තබන නැතහොත් මුද්‍රණය කිරීමට, පළ කිරීමට, බෙදා හැරීමට හෝ අලවා තැබීමට සලස්වන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය :

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, ඉහත කී නාම සහ ලිපිනයන් නැතහොත් එවැනි යම් නමක් හෝ ලිපිනයක් සඳහන් කර නොතිබීම, ප්‍රමාදයකින් හෝ ඒ හා සමාන වෙනත් යම් සාධාරණ හේතුවකින් සිදු වූ බවටත්, යම් අසද්භාවයක් නිසා සිදු නොවූ බවටත් යම් තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත්, යම් දැන්වීමක්, අත්පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍

යක් හෝ දැන්වීම් කොළයක් සම්බන්ධයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ, ඒ තැනැත්තා වරදකට වරදකරු නොවිය යුතු ය.

ජනමත විචාරණ කාර්යාල සංඛ්‍යාව පරිසීමා කිරීම.

49. (1) ජනමතවිචාරණයක ජනමතවිචාරණ නියෝජිතයකු වන නැතහොත් ඒ ජනමතවිචාරණ නියෝජිතයාගේ නියෝජිතයා වන තැනැත්තකුට—

(අ) 2 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශනයක් ප්‍රසිද්ධ කිරීමේ දිනයෙන් ආරම්භව, ඒ ජනමතවිචාරණයේ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත, මැතිවරණ කොට්ඨාසයේ එක් නිවේදිත මධ්‍ය ජනමතවිචාරණ කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයේ එක් නිවේදිත ශාඛා ජනමත විචාරණ කාර්යාලයක් හැර, යම් ජනමතවිචාරණ කාර්යාල යක් නොතිබිය යුතු ය ;

(ආ) ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙරාතුව ම වූ දින යෙන් ආරම්භව ඒ දිනයට ඉක්බිතිව ම එළඹෙන දින යෙන් අවසන් වන කාලය ඇතුළත, එක් එක් මැතිවරණ කොට්ඨාසයේ නිවේදිත මධ්‍ය ජනමතවිචාරණ කාර්යාලයක් හා එක් එක් ඡන්ද ප්‍රදේශය වෙනුවෙන් එක් නිවේදිත ශාඛා ජනමතවිචාරණ කාර්යාලයක් හැර, වෙනත් යම් ජනමතවිචාරණ කාර්යාලයක් නොතිබිය යුතු ය.

(2) යම් ජනමතවිචාරණ නියෝජිතයකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය ජනමතවිචාරණ කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) මේ වගන්තියෙහි සඳහන් යම් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක්, නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "නිවේදිත" යන පාඨය යම් ජනමතවිචාරණ කාර්යාලයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ කාර්යාලය පිහිටුවීමට පෙර එය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ද ඒ කාර්යාලය පිහිටි මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා වෙත ද දැනුම් දෙනු ලැබූ බව ඉන් අදහස් වේ.

අත් පත්‍රිකා, දැන්වීම් කොළ ආදිය ප්‍රදර්ශනය කිරීම හා සම්බන්ධ විධිවිධාන.

**50.** (1) 2 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශනය පළ කරන ලද දිනයෙන් ආරම්භව, ජනමතවිචාරණයක දී ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත, ජනමතවිචාරණයක් ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින්—

(අ) පොදු හෝ පෞද්ගලික කවර හෝ ස්ථානයක යම් කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ආ) ජනමතවිචාරණය ප්‍රවර්ධනය කිරීම සඳහා යම් ස්ථානයක රැස්වීමක් පැවැත්වීමට ඇති යම් දිනයක, ඒ ස්ථානය තුළ හෝ ඒ ස්ථානයෙහි හැර, මහජනයාට යාමට අයිතිවාසිකමක් ඇති හෝ ඉඩ දී ඇති යම් ස්ථානයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ලකුණක් හෝ සලකුණක් ; හෝ

(ඇ) යම් මහා මාර්ගයක් මත හෝ හරහා යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ලකුණක්, සළකුණක්, කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ඈ) යම් වාහනයක් තුළ හෝ වාහනයක් මත යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ලකුණක් හෝ සළකුණක්

ප්‍රදර්ශනය කරනු නො ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි සඳහන් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥේය වරදක් විය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩකිරීම වැළැක්වීම සඳහා යම් පොලිස් නිලධරයකු විසින් යුක්තියහගත ලෙස තමාට අවශ්‍ය විය හැකි යම් පියවරක් ගැනීම හා යම් බලයක් පාවිච්චි කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ විධිවිධාන කඩකිරීමෙහි ලා පාවිච්චි කරන ලද යම් අත පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, චිත්‍රයක්, ලකුණක්, සළකුණක්, කොඩියක් හෝ පතාකයක් තහනමට ගෙන ඉවත් කිරීම ද ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

මැතිවරණ වල දී රහස්‍යතාව රැක ගැනීම.

51. (1) ඡන්ද පොළකට හෝ ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී හෝ පැමිණ සිටීමට බලය දෙනු ලැබූ සෑම නිලධරයකු, ලිපිකරුවකු සහ ජනමතවිචාරණ නියෝජිතයකු නැතහොත් නියෝජිතයකු විසින් එසේ පැමිණීමට පෙර, මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දැක්වෙන "ඒ" ආකෘතියට සාරානුකූල ව්‍යවස්ථාපිත රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය. තේරීම් භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී ද ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු විසින් සමාදාන විනිශ්චයකාරවරයකු හෝ තේරීම් භාර නිලධරයා ඉදිරිපිට දී ද එම ප්‍රකාශය කළ යුතු අතර, එම ප්‍රකාශය වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන විට, තේරීම් භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු ඉදිරිපිට දී එය කරනු ලැබිය යුතු ය.

(2) ඡන්ද පොළකට පැමිණ සිටින සෑම නිලධරයකු, ලිපිකරුවකු, ජනමතවිචාරණ නියෝජිතයකු සහ නියෝජිතයකු විසින් ඒ ඡන්ද පොළෙහි ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව රැක ගැනීම සහ රැක ගැනීමට ආධාර වීම කළ යුතු අතර, නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, ඡන්ද පත්‍රිකාවක් සඳහා ඉල්ලුම් කර ඇති හෝ නැති නැතහොත් ඒ ඡන්ද පොළෙහි දී ඡන්දය දී ඇති යම් ඡන්දහිමියකුගේ ඡන්දහිමි නාම ලේඛනයෙහි සඳහන් නම හෝ අංකය පිළිබඳ වූ හෝ නිල ලකුණ පිළිබඳ වූ යම් තොරතුරක් ඒ කිසිම තැනැත්තකු විසින් ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර, යම් තැනැත්තකුට දැනුම් දෙනු නොලැබිය යුතු ය.

(3) ඒ කිසිම නිලධරයකු, ලිපිකරුවකු, ජනමතවිචාරණ නියෝජිතයකු හෝ නියෝජිතයකු විසින් සහ කවර හෝ තැනැත්තකු විසින් ඡන්ද පොළෙහි දී, යම් ඡන්දදායකයකු ඡන්දය දී ඇත්තේ හෝ ඡන්දය දීමට යන්නේ යෝජනාවට පක්ෂව ද විපක්ෂව ද යන වග පිළිබඳ තොරතුරු ලබා ගැනීමට තැත් කිරීම නැතහොත් ඡන්ද පොළක දී ඉහත කී කාරණය පිළිබඳව හෝ ඒ ඡන්ද පොළෙහි දී යම් ඡන්දදායකයකුට දෙන ලද ඡන්ද පත්‍රිකාවෙහි පිටපැත්තේ සඳහන් අංකය කුමක් ද යන වග පිළිබඳව ඒ ඡන්ද පොළෙහි දී ලබාගත් යම් තොරතුරක් කවර හෝ විටෙක යම් තැනැත්තකුට දැනුම් දීම නොකළ යුතු ය.

(4) ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ සිටින සෑම නිලධරයකු, ලිපිකරුවකු සහ ජනමතවිචාරණ නියෝජිතයකු හෝ ගණන් කිරීමේ නිරීක්ෂකයකු විසින් ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව රැක ගැනීම හා රැකගැනීමට ආධාර වීම කළ යුතු අතර, යම් ඡන්ද පත්‍රිකාවක පිට පැත්තේ සඳහන් අංකය ඒ ගණන් කිරීමේ දී නිසැකව දැන ගැනීමට තැත් කිරීම හෝ යම් ඡන්ද පත්‍රිකාවක් මගින් යම් ඡන්දයක් දෙන ලද්දේ යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ද යන වග පිළිබඳව ඒ ගණන් කිරීමේ දී ලබාගත් යම් තොරතුරක් කිසිවකුට දැනුම් දීම හෝ නොකළ යුතු ය.

(5) මේ පනතින් බලය දී ඇති කාර්යයක් සඳහා ක්‍රියා කරන ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඉහත කී පරිදි ඒ කාර්යය සඳහා බලය දෙනු ලැබ ක්‍රියා කරන

තැනැත්තකු විසින් හෝ හැර, කිසිම තැනැත්තකු විසින්, යම් ඡන්දදායකයකු ඡන්ද පත්‍රිකාවක් ලැබීමෙන් පසුව හා ඔහු එය ඡන්ද පෙට්ටියක් තුළට බහාලීමට පෙර, ඒ ඡන්දදායකයා සමග කතාබස් කිරීම හෝ කතාබස් කිරීමට තැත් කිරීම හෝ නොකළ යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට සත් අවුරුදු කාල සීමාවක් සඳහා මේ පනත යටතේ ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ යම් ජනමතවිචාරණයක දී ඡන්දය දීමට හෝ ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් නුසුදුසු විය යුතු ය.

### දූෂණ ක්‍රියා

හොර ඡන්ද දීම.

52. (1) යම් ජනමතවිචාරණයක දී—

(අ) ජීවත්ව සිටින හෝ මියගොස් ඇති හෝ ව්‍යාජ වූ හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෞද්ගලිකව හෝ තැපැලෙන් ඡන්දය දෙන ; නැතහොත්

(ආ) ඒ ජනමතවිචාරණයේ දී තමාගේ ම නමින් හෝ නම යටතේ එක් වරකට වඩා ඡන්දය දෙන

සෑම තැනැත්තකු ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥේය වරදක් විය යුතු, හොර ඡන්ද දීමේ වරදට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) පෞද්ගලිකව ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කොට ඇති ; හෝ

(ආ) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට ඉල්ලීමක් කර ඇති ; හෝ

(ඇ) තැපැලෙන් ඡන්දය දීමේ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් වලංගු ලෙස හෝ නොඑසේව ලකුණු කොට එවා ඇත්තා වූ

තැනැත්තකු, ඡන්දය දී ඇති ලෙස සැලකිය යුතු ය.

සංග්‍රහ කිරීම.

53. ජනමතවිචාරණයකට පෙර, ජනමතවිචාරණයක් පැවැත්වෙන අතරතුර හෝ ජනමතවිචාරණයකින් පසු, තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා උදෙසා හෝ ඒ තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ඡන්දය ඒ ජනමතවිචාරණයේ දී දීමට හෝ

දීමෙන් වැළකීමට දූෂිත ලෙස බලපෑමේ කාර්යය සඳහා නැතහොත් ඒ ජනමතවිචාරණයේ දී එබඳු යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමට නැතහොත් ඡන්දය දීමෙන් වැළකීමට සූදානම්ව සිටීම හේතුකොට ගෙන කෙළින් ම හෝ අන්‍ය කාරයකින් යම් කෑමක්, බීමක්, විශ්‍රාන්තියක් හෝ ආහාර ද්‍රව්‍යයක් දෙන හෝ සපයන නැතහොත් දීමට හෝ සැපයීමට සලස්වන නැතහොත් දීමෙහි හෝ සැපයීමෙහි ලා ආධාර වන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට පොරොන්දු වන නැතහොත් යම් කෑමක්, බීමක්, විශ්‍රාන්තියක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබා ගත හැකි වනු පිණිස යම් මුදලක් හෝ බලපත්‍රයක් දෙන හෝ සපයන නැතහොත් වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් සලස්වන හෝ දීමට හෝ සැපයීමට සලස්වන නැතහොත් දීමෙහි හෝ සැපයීමෙහි ලා ආධාර වන සෑම තැනැත්තකු ම සහ එවැනි යම් කෑමක්, බීමක් හෝ විශ්‍රාන්තියක් හෝ ආහාර ද්‍රව්‍යයක් නැතහොත් එවැනි යම් මුදලක් හෝ බලපත්‍රයක් දූෂිත ලෙස භාරගන්නා හෝ ලබාගන්නා නැතහොත් එවැනි යම් කෑමක්, බීමක් හෝ විශ්‍රාන්තියක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබා ගත හැකි වනු පිණිස එවැනි වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් යොදා ගන්නා සෑම ඡන්ද හිමියකු ම සංග්‍රහ කිරීමේ වරදට වරදකරු විය යුතු ය.

අයුතු බල පෑම.

**54.** (1) යම් ජනමතවිචාරණයක දී යම් තැනැත්තකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකී සිටීමට ඒ තැනැත්තා පෙළඹවීම හෝ ඔහුට බලකිරීම සඳහා නැතහොත් ඒ තැනැත්තා යම් ජනමත විචාරණයක දී ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන කෙළින්ම හෝ අන් අයුරකින් තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඔහුට එරෙහිව යම් බලපෑමක්, සාහසික කමක්, අවහිර කිරීමක් කරන හෝ කරන බවට තර්ජනය කරන නැතහොත් තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඔහුට එරෙහිව යම් ලෞකික හෝ අධ්‍යාත්මික පීඩාවක්, පාඩුවක්, හානියක්, අලාභයක් පමුණුවන හෝ පමුණුවන බවට තර්ජනයක් කරන නැතහොත් පැහැර ගෙන යාමෙන්, අන්තර්ජනය කිරීමෙන් හෝ යම් වංචනික උපායකින් හෝ උපක්‍රමයකින් යම් ඡන්ද හිමියකුට ඔහුගේ ඡන්ද බලය නිදහස් ලෙස පාවිච්චි කිරීමට බාධා පමුණුවන හෝ එසේ කිරීම වළක්වන නැතහොත් යම් ජනමතවිචාරණයක දී යම් ඡන්ද හිමියකුට ස්වකීය ඡන්දය දීමට හෝ දීමෙන් වැළකීමට ඒ මගින් බල කරන, පෙළඹවන හෝ කැමති කරවන සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරද කරු විය යුතු ය.

(2) 2 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීමේ දින යෙන් ආරම්භව, යම් ජනමතවිචාරණයක ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ යම් වේලාවක—

(අ) ඒ ජනමතවිචාරණයේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ජනමතවිචාරණයේ දී යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දෙන ලෙස

හෝ දීමෙන් වළකින ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීමේ කාර්ය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් වචන පවසන ; නැතහොත්

(ආ) ඒ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත්පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ලකුණක්, සලකුණක්, කොඩියක් හෝ පතාකයක් බෙදාහරින හෝ ප්‍රදර්ශනය කරන ; නැතහොත්

(ඇ) යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ජනමතවිචාරණය නැතහොත් ජනමතවිචාරණ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට සලස්වන

සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(3) යම් ජනමතවිචාරණයක දී යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ජනමතවිචාරණයේ දී යම් යෝජනාවකට ආධාර දීමට, ආධාර දීමෙන් වැළකී සිටීමට ආගමික නිකායක හෝ සංවිධානයක යම් සාමාජිකයකු හෝ අනුගාමිකයකු පෙළඹවීම සඳහා හෝ ඔහුට බලකිරීම සඳහා නැතහොත් ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ ජනමතවිචාරණයේ දී යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන, නැතහොත් ඔහු ඒ ජනමත විචාරණයේ දී ඒ යෝජනාවට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතු කොටගෙන—

(අ) ඒ සාමාජිකයාට හෝ අනුගාමිකයාට ඒ සාමාජිකයාගේ හෝ අනුගාමිකයාගේ පවුලේ යම් සාමාජිකයකුට, ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා සාමාන්‍යයෙන් කටයුතු කිරීමේ දී හිමිකම් ලැබෙන්නට තිබුණු යම් අධ්‍යාත්මික සේවාවක්, මෙහෙයක් හෝ ප්‍රතිලාභයක් ප්‍රතික්ෂේප කරන හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරන ; හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ නිකායෙන් හෝ සංවිධානයෙන් බැහැර කරන හෝ බැහැර කරන බවට තර්ජනය කරන

ඒ ආගමික නිකායේ හෝ සංවිධානයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(4) යම් ජනමතවිචාරණයක දී යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ජනමත විචාරණයේ දී යෝජනාවට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකී සිටීමට, වෙනත් යම් තැනැත්තකුගේ සේවා යෝජකයකු වන්නාවූ යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තා පෙළඹවීම හෝ ඔහුට බලකිරීම සඳහා, නැතහොත් ඒ වෙනත් තැනැත්තා ඒ ජනමත විචාරණයේ දී යෝජනාවට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන, හෝ ඔහු ඒ ජනමතවිචාරණයේ දී යම් යෝජනාවකට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන—

(අ) ඒ වෙනත් තැනැත්තා ඒ සේවානියුක්තිය අවසන් කරනහොත් හෝ අවසන් කරන බවට තර්ජනය කරතහොත් ; හෝ

(ආ) ඒ වෙනත් තැනැත්තා විසින් ඒ සේවානියුක්තියෙහි සාමාන්‍යයෙන් යෙදී සිටීමේ දී එවකටත් ඔහු භුක්ති විඳිමින් සිටි හෝ ඔහු විසින් භුක්ති විඳිමට තිබුණු යම් ප්‍රතිලාභයක් ගෝ සේවාවක් ඒ වෙනත් තැනැත්තාට ප්‍රතික්ෂේප කරතහොත් හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරතහොත්

ඒ සේවා යෝජක අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

55. පහත සඳහන් තැනැත්තන්, එනම්,— අල්ලස්.

(අ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට යම් ඡන්දහිමියකු පෙළඹවීම සඳහා තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මඟින්, යම් ඡන්දහිමියකුට හෝ ඡන්දහිමියකු සඳහා නැතහොත් යම් ඡන්දහිමියකු වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන, ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟවන හෝ දීමට ඉදිරිපත්වන, පොරොන්දුවන නැතහොත් ලබාදීමට හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ පනත යටතේ වූ යම් ජනමතවිචාරණයක දී ඒ ඡන්දහිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතු කොට ගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකු ම;

(ආ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට යම් ඡන්දහිමියකු පෙළඹවීම සඳහා තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මඟින් ඒ ඡන්ද හිමියාට හෝ ඒ ඡන්දහිමියා සඳහා හෝ යම් ඡන්දහිමියකු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා නැතහොත් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් යම් තිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දෙන හෝ ලබා දෙන නැතහොත් දීමට හෝ ලබා දීමට එකඟවන හෝ ඉදිරිපත්වන, පොරොන්දුවන නැතහොත් ලබාදීමට හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ පනත යටතේ වූ යම් ජනමතවිචාරණයක දී ඒ ඡන්දහිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකු ම;

(ඇ) මේ පනත යටතේ වූ යම් ජනමතවිචාරණයක දී යම් ඡන්දහිමියකුගේ ඡන්දය යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව දීමට, ඡන්දය ලබාදීම සිදුකිරීමට හෝ සිදුකිරීමෙහි ලා උත්සාහ කිරීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මඟින් හෝ ඒ තැනැත්තාහට හෝ ඒ තැනැත්තා සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ ගිවිසුමක් දෙන හෝ කරන සෑම තැනැත්තකු ම:

(ඈ) එවැනි යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ ගිවිසුමක් මත හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන්, මේ පනත යටතේ වූ ජනමතවිචාරණයක දී යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දෙන සෑම තැනැත්තකු ම ;

(ඉ) මේ පනත යටතේ වූ ජනමතවිචාරණයක දී අල්ලස් වශයෙන් යම් මුදලක් හෝ එහි යම් කොටසක් වියදම් කළ යුතු ය යන චේතනාවෙන් ඒ වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා ඒ මුදල කලින් දෙන, ගෙවන හෝ ගෙවීමට සලස්වන නැත හොත් එවැනි යම් ජනමතවිචාරණයක දී අල්ලස් වශයෙන් වියදම් කරන ලද යම් මුදලක්, සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් නිදහස් කිරීම හෝ ආපසු ගෙවීම සඳහා දුන දුනම යම් තැනැත්තකුට යම් මුදලක් ගෙවන හෝ ගෙවීමට සලස්වන සෑම තැනැත්තකු ම ;

(ඊ) මේ පනත යටතේ වූ ජනමතවිචාරණයකට පෙර හෝ එය පවත්වනු ලබන අතරතුර, එවැනි යම් ජනමතවිචාරණයක දී ඡන්දය දීම හෝ ඡන්දය දීමට එකඟවීම නැතහොත් ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට එකඟවීම හේතුකොටගෙන තමා සඳහා ම හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා තමා හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, යම් මුදලක්, තෑග්ගක්, ණයක් හෝ වටිනා ප්‍රතිඡ්ඡාවක්, තිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් කෙළින්ම හෝ අන් අයුරකින් ලබා ගන්නා හෝ ලබා ගැනීමට එකඟ වන හෝ ඒ සඳහා ගිවිසුමකට එළඹෙන්නා වූ සෑම ඡන්දහිමියකු ම ;

(උ) මේ පනත යටතේ වූ ජනමතවිචාරණයකට පසු, එවැනි යම් ජනමතවිචාරණයක දී යම් තැනැත්තකු විසින් ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නැතහොත් ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවා තිබීම හේතුකොට ගෙන යම් මුදලක් හෝ වටිනා ප්‍රතිඡ්ඡාවක්, තමා හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, කෙළින්ම හෝ අන් අයුරකින් ලබා ගන්නා සෑම තැනැත්තකු ම

අල්ලස් වරදකට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම සහ අශක්තතා.

56. (1) (අ) හොර ඡන්ද දීමේ වරද සිදු කරන හෝ හොර ඡන්දය දීමේ වරද සිදු කිරීමට ආධාර කරන, අනුබල දෙන, උපදෙස් දෙන හෝ ඒ වරද කිරීම සිදු කරවන ; සහ

(ආ) සංග්‍රහ කිරීමේ, අයුතු බලපෑමේ හෝ අල්ලස් පිළිබඳ වරද සිදු කරන

සෑම තැනැත්තකු ම, දූෂණ ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් වරදක් සම්බන්ධයෙන් වන අවස්ථාවක මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව

බන්ධනාගාරගත කිරීමකට ද මෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ සෑම තැනැත්තකු ම යටත් විය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඔහු එසේ වරදකරු කරනු ලැබූ දින සිට, අවුරුදු හතක කාලයක් සඳහා ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ පනත යටතේ ජනමතවිචාරණයක දී ඡන්දය දීමට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් අශක්‍යතාවකට පත්විය යුතු අතර, ඒ දිනට ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබ සිටියේ නම්, ඔහුගේ තේරී පත්වීම, ඒ වරදකරු කරනු ලැබූ දින සිට අත්හළ යුතු ය.

(3) දූෂණ ක්‍රියාවක් සඳහා වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව, කරනු නොලැබිය යුතු ය.

## නීති විරෝධී ක්‍රියා

**57.** (1) ජනමතවිචාරණයක දී—

ඇතැම් වියදම් නීති විරෝධී ක්‍රියා විය යුතු බව.

(අ) ඡන්ද විමසන ස්ථානය වෙත හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට හෝ ඡන්ද හිමියන් ගෙන යාම හේතු කොට ගෙන කවර හෝ වර්ගයක වාහන හෝ ප්‍රවාහන සතුන් කුලියට ගැනීම සඳහා හෝ දුම්රිය ගාස්තු සඳහා හෝ අන්‍යාකාරයකින් කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය; නැතහොත් ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇති කර ගනු නොලැබිය යුතු ය; නැතහොත්

(ආ) යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ගෙයක්, ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම හේතු කොට ගෙන නැත හොත් යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හේතු කොටගෙන හෝ, ඡන්ද හිමියකුට කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය; නැතහොත් ඡන්ද හිමියකු සමග ගෙවීම සඳහා කිසිම ගිවිසුමක් ඇති කර ගනු නොලැබිය යුතු ය.

(2) මේ පනත අනුව ඉඩ දෙනු ලැබිය හැකි යම් ව්‍යතිරේකයකට යටත්ව, ජනමතවිචාරණයකට පෙර හෝ ජනමතවිචාරණයක් පවත්වනු ලබන අතරතුර හෝ ජනමතවිචාරණයකින් පසුව හෝ මේ වගන්තිය කඩකරමින් දැන දැනම යම් ගෙවීමක් කරනු ලැබුව හොත් හෝ ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇති කර ගනු ලැබුවහොත් ඒ ගෙවීම කළ හෝ ගිවිසුම ඇති කරගත් තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, තම ක්‍රියාවෙන් මෙම වගන්තිය කඩ කිරීමක් බව දැන දැනම, ඒ ගෙවීම ලබන හෝ එවැනි යම් ගිවිසුමකට පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු ද නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(3) මේ පනතින් හෝ ඒ යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබිය හැකි යම් ප්‍රකාශිත ව්‍යතිරේකවලට යටත්ව, යම් මැතිවරණ කොට්ඨාසයක ජනමතවිචාරණයක දී, ඡන්ද විමසීම ආරම්භ වන වේලාවට එක් පැයකට පෙර ආරම්භ වන්නා වූ ද ඒ ඡන්ද විමසීම අවසන් කරන ලද වේලාවට එක් පැයකට පසු අවසන් වන්නා වූ ද කාලය ඇතුළත යම් තැනැත්තකු විසින් ඒ කො ට්ඨාසයෙහි—

(අ) ඡන්ද විමසන ස්ථානය වෙත හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට හෝ ඡන්දදායකයන් ගෙන යාමේ කාර්යය සඳහා; හෝ

(ආ) (i) යම් නිත්‍යානුකූල කටයුත්තක්;

(ii) යම් නිල කටයුත්තක්, එනම්, තමා විසින් දරනු ලබන යම් නිලයකින් හෝ තමා විසින් කරනු ලබන යම් සේවාවකින් හෝ තමා විසින් කරගෙන යනු ලබන යම් සේවා නියුක්තියකින් හෝ උද්ගතවන නැත හොත් ඊට සම්බන්ධ වන නැතහොත් ඊට ආනුෂංගික වන හෝ යම් කාර්යයක් කිරීම හෝ යම් කර්තව්‍ය යක් ඉටු කිරීම පිණිස

නොවන වෙනත් යම් කාර්යයක් සඳහා,

යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, අතමාරුවට දීම, සේවයේ යෙදවීම, කුලියට ගැනීම, අතමාරුවට ගැනීම හෝ පාවිච්චි කිරීම, හෝ යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලි යට දීමට, අතමාරුවට දීමට, සේවයේ යෙදවීමට, කුලියට ගැනීමට, අතමාරුවට ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙනත් යම් තැනැත් තකුට ආධාර දීම හෝ අනුබල දීම නොකළ යුතු ය.

මෙම උපවගන්තිය කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) දැන්වීම් නියෝජිතයකු වශයෙන් ගෙවීමක් මත පත්‍රිකා සහ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම ඡන්ද හිමියකුගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුත්ත වන අවස්ථාවක, ඒ ඡන්ද හිමියා වෙත කරනු ලබන ගෙවීමක් හෝ ඔහු සමග එළඹෙනු ලබන ගිවිසුමක්, ඒ ගෙවීම හෝ ගිවිසුම හෝ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී කරන ලද්දේ නම්, හෝ එළඹෙන ලද්දේ නම් හෝ ඒ ගෙවීම හෝ ගිවිසුම මේ වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නො ලැබිය යුතු ය;

(ආ) ජනමතවිචාරණයක දී, ඡන්ද හිමියන්ට, ස්වකීය පදිංචි ස්ථානයෙහි සිට මුහුද හෝ මුහුදෙහි ශාඛාවක් හෝ මුහුදු කඩිත්තක් හෝ ගංගාවක් හෝ හරහා නොගොස් තම ඡන්ද පොළවල් කරා ළඟාවීමට නොහැකි වන අවස්ථාවක, ඒ ඡන්ද හිමියන් ඔවුන්ගේ ඡන්ද පොළවල් කරා මුහුදින්

ගෙන යම සඳහා හෝ ඔවුන්ගේ ඡන්ද පොළවල් වෙත ළඟාවීම පිණිස ඔවුන්ට ගඟින් එතෙර විය හැකි වනු පිණිස හෝ විධිවිධාන සලසනු ලැබිය හැකි ය;

(ඇ) ජනමතවිචාරණයක දී, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය සේවය මගින් සලසනු ලබන යම් මහජන ප්‍රවාහන සේවයකින්, යම් තැනැත්තකු තමාගේ ම වියදමින් ඡන්ද විමසන ස්ථානය වෙත හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට, ගමන් කිරීම, නැතහොත් ඡන්ද විමසන ස්ථානය වෙත හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට තමාට ගමන් කිරීමේ කාර්යය සඳහා, ඉහත සඳහන් යම් තැනැත්තකු විසින් තමාගේ ම වියදමින් එවැනි සේවයක් පාවිච්චි කිරීම හෝ මෙම වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය;

(ඈ) යම් ශාරීරික අබලතාවක් නිසා, තමාට ඡන්ද විමසන ස්ථානය වෙත සහ ඡන්ද විමසන ස්ථානයේ සිට පයින් හෝ මෙම උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් මහජන ප්‍රවාහන සේවයකින් හෝ ගමන් කළ නොහැකි බව, ජනමත විචාරණයක දී ඡන්ද විමසීමක් පැවැත්විය යුතු දිනයට දින හතකට පෙර, ඒ මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයාට ලැබෙන පරිදි යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකු විසින් හෝ කරනු ලැබූ ලිඛිත ඉල්ලීමක් අනුව, යම් ශාරීරික අබලතාවක් නිසා ඡන්ද විමසන ස්ථානයට සහ ඡන්ද විමසන ස්ථානයේ සිට පයින් හෝ මේ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් මහජන ප්‍රවාහන සේවයකින් ඒ තැනැත්තාට ගමන් කළ නොහැකි බව තේරීම් භාර නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට හෝ ගමන් කිරීමේ කාර්යය සඳහා යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිත බලයක් ඒ තේරීම් භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට දෙනු ලැබිය හැකි අතර, ඒ අනුව, එසේ තමාට ගමන් කිරීමේ කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කරනු ලැබීම මේ වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(5) යම් මැතිවරණ කොට්ඨාසයක පවත්වනු ලබන යම් ඡන්ද විමසීමක දී යම් පොලිස් නිලධරයකු විසින් ස්වකීය මෙහෙයවීමෙන්ම හෝ යම් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත පොලිස් නිලධරයකු විසින් කළ යුතු යයි මෙයින් නියම කර ඇති විමර්ශනයකින් පසු හෝ යම් වාහනයක්, ජලයාත්‍රාවක් හෝ සතකු (1) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් පාවිච්චි කරනු ලබන බවට ඒ පොලිස් නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ නිලධරයා විසින් ඒ වාහනය, ජලයාත්‍රාව හෝ සතා නවත්වා තහනමට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඡන්ද විමසීම අවසන් වන තෙක් ඒ වාහනය, ජල යාත්‍රාව හෝ සතා එහි රඳවා තබා ගත යුතු ය.

(6) මේ වගන්තියේ අර්ථානුකූලවූ නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, ඒ ක්‍රියාව සිදුකිරීමෙහි ලා හෝ ඒ ක්‍රියාව සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, ජලයාත්‍රාවක් හෝ සතකු තහනමට ගත යුතු බව ප්‍රකාශයට පත් කරමින් මහාධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ප්‍රවෘත්ති පත්‍රවල අසත්‍ය වාර්තා.

58. (1) යම් ප්‍රවෘත්ති පත්‍රයක—

(අ) ජනමතවිචාරණයක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ යම් තැනැත්තකුගේ කථා හෝ කටයුතු පිළිබඳව හෝ සම්බන්ධයෙන් ; නැතහොත්

(ආ) එවැනි යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ තැනැත්තකු විසින් ඒ ජනමතවිචාරණයක කටයුතු පවත්වාගෙන යාම හෝ මෙහෙයවීම පිළිබඳව හෝ සම්බන්ධව

යම් අසත්‍ය ප්‍රකාශයක් පළ කරනු ලැබූ සහ ඒ ප්‍රකාශය ඒ ජනමත විචාරණයේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑ හැකි අවස්ථාවක, එසේ එය පළ කරනු ලැබූ අවස්ථාවේ දී ඒ ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරු, කළමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් එවැනි නිලධරයකුව සිටි නැතහොත් එවැන්නකුගේ තත්ත්වයකින් ක්‍රියා කරන ලදැයි සලකනු ලබන සෑම තැනැත්තකු ම, ඒ පළකිරීම කරනු ලැබුවේ තමාගේ අනුමතය හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ඒ තත්ත්වයෙන් වූ ස්වකීය කටයුතුවල ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත්ව තමා විසින් යෙදිය යුතුව තිබුණු පරිදි සියලු උද්‍යෝගය, ඒ පළකිරීම වැළැක්වීම පිණිස තමා විසින් යොදනු ලැබූ බව, ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ එක් එක් තැනැත්තා නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියෙහි "ප්‍රවෘත්ති පත්‍රය" යන යෙදුමට යම් වාර සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ.

ඇතැම් සේවා නියුක්ති නීති විරෝධී බව.

59. (1) පහත දැක්වෙන කාර්යය සඳහා හෝ තත්ත්වයෙන් හැර, වෙනත් කවර හෝ කාර්ය සඳහා හෝ තත්ත්වයකින් කිසිම තැනැත්තකු ජනමතවිචාරණයක් ප්‍රවර්ධනය කිරීමෙහි ලා ගෙවීමක් මත හෝ ගෙවීමේ පොරොන්දුව පිට සේවයෙහි යොදා ගැනීම හෝ නියුක්ත කර ගැනීම නොකළ යුතු ය:—

(අ) ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ යම් ඡන්ද ස්ථාන නිරීක්ෂකයකුගේ පත්වීම අවලංගු කිරීමට ඇතිවිය හැකි අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා ඡන්ද ස්ථාන නිරීක්ෂකයන් යුක්ති සහගත සංඛ්‍යාවක් සහ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානය සඳහා ගණන් කිරීමේ නිරීක්ෂකයන් දෙදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ;

(ආ) මැතිවරණ කොට්ඨාසයට අයත් ප්‍රදේශය සහ ඒ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි වූ ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව කෙරෙහි සැලකිලිමත්ව, ලිපිකරුවන් හා පණිවුඩකරුවන් යුක්ති සහගත සංඛ්‍යාවක්.

(2) මේ පනත අනුව ඉඩ දිය හැකි යම් ව්‍යතිරේකයකට යටත්ව, ජනමතවිචාරණයකට පෙර, ජනමතවිචාරණයක් පවත්වනු ලබන අතරතුර, හෝ ජනමතවිචාරණයකින් පසු හෝ මේ වගන්තිය කඩ කරමින් යම් තැනැත්තකු සේවයෙහි යොදා ඇත්නම් නැතහොත් සේවයෙහි නියුක්ත කර ඇත්නම්, ඔහු සේවයෙහි යොදාගත් නැතහොත් නියුක්ත කළ තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වන්නේ ය.

මැතිවරණ ප්‍රකාශන මුද්‍රණය කිරීම ආදිය.

60. ජනමතවිචාරණයක් පිළිබඳව සඳහන් වන, එහෙත් මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකයාගේ නම් සහ ලිපිනයන් ඒ මුහුණතෙහි නොදැක්වෙන, යම් ප්‍රචාරක දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් මුද්‍රණය කරන, පළ කරන, බෙදා හරින හෝ අලවන නැතහොත් මුද්‍රණය කරවීමට, ප්‍රකාශයට පත් කරවීමට, බෙදා හැරීමට හෝ ඇලවීමට සලස්වන යම් තැනැත්තකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට දඬුවම.

61. (1) නීති විරෝධී ක්‍රියාවක් සිදු කළ සෑම තැනැත්තකු ම, මහාධිකරණය විසින්, වරදකරු කරනු ලැබූ විට, රුපියල් තුන් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, වරදකරු කරනු ලැබූ දින සිට, අවුරුදු හතක කාලයක් සඳහා, මේ පනත යටතේ වූ ජනමතවිචාරණයක දී ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් අශක්‍යතාවකට පත් විය යුතු ය. තව ද ඒ වරදකරු කරනු ලැබූ දිනයේ දී ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබ සිටියේ නම්, ඔහුගේ ඒ තෝරා පත්කර ගැනීම, ඒ වරදකරු කරනු ලැබූ දින සිට නිෂ්ප්‍රභ විය යුතු ය.

(2) නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

යෝජනා එකකට වැඩි ගණනක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක.

62. 2 වන වගන්තිය යටතේ වූ යම් ප්‍රකාශනයක, ජනමත විචාරණයක දී, ජනතාව වෙත ඉදිරිපත් කරනු ලැබීම සඳහා යෝජනා එකකට වැඩි ගණනක් ජනාධිපතිවරයා විසින් සඳහන් කරනු ලැබ ඇති අවස්ථාවක, එවැනි එක් එක් යෝජනාව එකිනෙකට වෙනස් පාටින් යුත් වෙනම ඡන්ද පත්‍රිකාවක මුද්‍රණය කරනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව මේ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ජනමතවිචාරණයට අදාළ විය යුතු ය.

අසාමාන්‍ය අවස්ථාවල දී ජනමත විචාරණයක් පවත්වන ලෙස නියම කිරීමට ඇති බලය.

63. ජනාධිපතිවරයා විසින්, ජනමතවිචාරණය සඳහා දිනය ප්‍රකාශනය මගින් නියම කිරීමෙන් පසු යම් අවස්ථාවක, කවර වූ හෝ හේතුවක් නිසා ඒ ප්‍රකාශනය අනුව යම් මැතිවරණ කොට්ඨාසයක හෝ එහි යම් කොටසක හෝ ජනමතවිචාරණයක් පවත්වා නැති බවට ජනාධිපතිවරයා සෑහීමට පත් වන පරිදි පෙන්වනු ලැබුවහොත්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඒ කොට්ඨාසයෙහි හෝ එහි කොටසක ජනමතවිචාරණයක් පැවැත්විය යුතු බවට වෙනත් ප්‍රකාශනයක්, කවර අවස්ථාවක වුව ද ඔහු විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. තව ද ඒ වෙනුවෙන් මේ පනතේ විධිවිධාන ඒ මැතිවරණ කොට්ඨාසය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය:

එසේ වුව ද ජනමතවිචාරණය පවත්වනු නොලැබුවේ යම් මැතිවරණ කොට්ඨාසයක ද නැතහොත් ඉන් කොටසක ද ඒ කොට්ඨාසයේ හෝ කොටසේ ඡන්දදායකයන්ගේ මුළු සංඛ්‍යාව අනුව, ඒ ජනමතවිචාරණයේ දී ඒ ඡන්ද කොට්ඨාසයේ හෝ ඉන් කොටසක ඡන්දදායකයන් විසින් ඡන්දය දෙනු ලැබීම හේතුවෙන් 40 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා වෙත වාර්තා කරනු ලැබූ ප්‍රතිඵලය කෙරෙහි වැදගත් ලෙස බලපෑමක් ඇති නොවන අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ වෙනත් ප්‍රකාශනයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම් පැහැර හැරීම.

64. ජනමතවිචාරණයට අදාළ මේ පනතේ විධිවිධානවල දක්වා ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව ජනමතවිචාරණය පවත්වනු ලැබූ බව සහ එකී විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම, ජනමතවිචාරණයේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑ නොමැති බව පෙනී යන්නේ නම්, මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමේ හේතුවෙන් කිසිම ජනමතවිචාරණයක් අවලංගු නොවිය යුතු ය.

ඡන්ද පොළවල් වශයෙන් පාඨශාලා පාවිච්චි කිරීම.

65. (1) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් ආධාර මුදලක් ලබන හෝ ආධාර මුදලක් ප්‍රදානය කරනු ලැබූ යම් පාඨශාලාවක් හෝ පාඨශාලාවක යම් කොටසක් ඡන්ද පොළක් වශයෙන් ගාස්තුවක් නොමැතිව, තේරීම් භාර නිලධරයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(2) තේරීම් භාර නිලධරයකු විසින්, ඉහත කී පරිදි එවැනි යම් පාඨශාලාවක් හෝ එහි කොටසක් ඡන්ද පොළක් වශයෙන් පාවිච්චි කරනු ලැබීමේ හේතුවෙන්, එයට සිදු වූ යම් අලාභයක් පියවීම හා එහි පාලනය භාර තැනැත්තන් විසින් දරනු ලැබූ යම් වියදමක් ගෙවීම, තේරීම් භාර නිලධරයා විසින් කළ යුතු ය.

ඡන්ද ස්ථානාධිපතිවරයාට සහාය පිණිස පත් කරන ලද නිලධරයන් මගින් ඔහුට ක්‍රියා කළ හැකි බව.

66. ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින්, යම් තැනැත්තකු සිරභාරයට ගැනීමට, ඡන්ද පොළෙන් බැහැර කිරීමට හෝ ඡන්ද පොළෙන් ඉවත් කිරීමට නියම කිරීම හැර, මේ පනත මගින් ඒ ඡන්ද පොළේ දී ඡන්ද ස්ථානාධිපතිවරයාට මේ පනතින් නියමිත හෝ බලය දෙන ලද යම් ක්‍රියාවක්, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, ඔහුට සහාය වීමට පත් කරන ලද නිලධරයන් මගින් ඒ ඡන්ද පොළෙහි දී කරනු ලැබිය හැකි ය.

**67.** යම් පිළිගත් දේශපාලන පක්ෂයක ඡන්ද ස්ථාන නිරීක්ෂකයකු හෝ ගණන් කිරීමේ නිරීක්ෂකයකු හෝ වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබුවේ නම්, ඔවුන් විසින් කළ යුතු බවට නියමිත හෝ බලය දෙන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ම කළ හැකි ය. නැතහොත් එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට එවැනි නියෝජිතයකුට සහාය විය හැකි ය. එහෙත් මේ වගන්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර, එවැනි නියෝජිතයකු විසින් 51 වන වගන්තිය යටතේ කළ යුතු යම් නියමිත ප්‍රකාශයක් ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් කරනු ලැබිය යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් විසින්, ස්වකීය ම නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම හෝ තම නියෝජිතයාට සහාය වීම හෝ කරනු ලැබිය හැකි බව.

**68.** මේ පනත යටතේ වූ ජනමතවිචාරණයක දී පිළිගත් දේශපාලන පක්ෂයක නියෝජිතයා හෝ නියෝජිතයන් හෝ ඉදිරියෙහි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට මේ පනතින් නියමිතව හෝ බලය දෙන ලද අවස්ථාවක, ඒ පක්ෂයේ යම් නියෝජිතයකු හෝ නියෝජිතයන් හෝ ඒ කාර්යය සඳහා නියමිත වේලාවට හා ස්ථානයට පැමිණ නොසිටිය ද වෙනත් ආකාරයකින් යථා පරිදි කරන ලද්දේ නම්, එසේ කරන ලද ක්‍රියාව හෝ දෙය නිර්බල නොවිය යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයේ නියෝජිතයන් පැමිණ නොසිටීම.

**69.** මේ පනත යටතේ හෝ එහි කාර්ය සඳහා හෝ සම්පාදිත නැතහොත් නිකුත් කරන ලද යම් නාම ලේඛනයක, දැන්වීමක හෝ වෙනත් කවර හෝ ලේඛනයක නම් කර ඇති හෝ විස්තර කර ඇති යම් තැනැත්තකු හෝ ස්ථානයක් හෝ හඳුනාගත හැකි වන පරිදි ඒ නාම ලේඛනයෙහි, දැන්වීමෙහි හෝ වෙනත් ලේඛනයෙහි පෙන්වා ඇත් නම්, ඒ තැනැත්තා හෝ ස්ථානය හෝ පිළිබඳව ඒ නාම ලේඛනයෙහි, දැන්වීමෙහි හෝ වෙනත් ලේඛනයෙහි සඳහන් කිසිදු වැරදි නාමයකින් හෝ සාවද්‍ය විස්තරයකින්, ඒ තැනැත්තා හෝ ස්ථානය සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක වීම කෙරෙහි කවර වූ හෝ ආකාරයක බලපෑමක් ඇති නොවිය යුතු ය.

ස්ථාන හා තැනැත්තන් පිළිබඳ සාවද්‍ය විස්තර.

**70.** (1) යම් දැන්වීමක් පළ කරන ලෙස මේ පනතින් නියමිතව ඇත්තා වූ ද, ඒ දැන්වීම පළ කිරීමට මේ පනතින් නියමිත ක්‍රමයෙන් ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ඒ දැන්වීමට නොලැබෙන බව ඒ දැන්වීම පළ කිරීමට නියම කරනු ලැබූ බලධරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, මේ පනතින් නියමිත ආකාරයට ඒ දැන්වීම පළ කිරීමට අමතරව, ඒ දැන්වීම අදාළ වන්නා වූ මැතිවරණ කොට්ඨාසය ඇතුළත ප්‍රකටව පෙනෙන ස්ථානවල, ඒ දැන්වීමේ පිටපත් ප්‍රදර්ශනය කරවීම හෝ ඊට ප්‍රසිද්ධිය ලබා දීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන වෙනත් යම් පියවර ගැනීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

පනත දක්වෙන පරිදි දැන්වීම් ආදිය ප්‍රකාශයට පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලධරයකු විසින් ප්‍රදර්ශනය කරනු ලැබූ යම් දැන්වීමක් හෝ මේ පනත අනුව පරීක්ෂණය සඳහා තබා ඇති යම් ලේඛනයක්, නීත්‍යනුකූල අවසරයක් නොමැතිව, විනාශ කරන, එහි කොටස් කපා හරින, එය විරූප කරන හෝ ඉවත් කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ඡන්දය දීමට සේවා නියුක්තයන්ට හැකි වනු පිණිස ඔවුන්ට නිවාඩු දීම සේවායෝජක යන් ගේ යුතුකම බව.

71. (1) ජනමතවිචාරණයක දී පෞද්ගලිකව ඡන්දය දීමට හිමිකම් ඇති වෙනත් යම් තැනැත්තකුගේ සේවා යෝජකයකු වන යම් තැනැත්තකු විසින්, ඒ වෙනත් තැනැත්තා විසින් ඡන්දය දීම පිණිස නිවාඩු දෙන ලෙස ලියවිල්ලකින් ඉල්ලීමක් කළ විට, ඒ ජනමතවිචාරණයේ දී ඒ වෙනත් තැනැත්තාට පෞද්ගලිකව ම ඡන්දය දීමට හැකිවනු පිණිස ප්‍රමාණවත් යයි ඒ සේවායෝජකයා විසින් සලකනු ලබන (පැය හතරකට නො අඩු කාලයක) යම් අඛණ්ඩ කාලයක් ඒ වෙනත් තැනැත්තාට, වැටුප් සහිත නිවාඩු දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ඡන්ද පොළවල් ලෙස පාවිච්චි කිරීම සඳහා ස්ථාන බලකර ලබා ගැනීම.

72. (1) 65 වන වගන්තියේ සඳහන් වන යම් පාඨශාලාවක් නොවන යම් වෙනත් ස්ථානයක් ඡන්ද පොළක් වශයෙන් පාවිච්චි කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය බව කොමසාරිස්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ ස්ථානයෙහි නියම සන්තකය දරන තැනැත්තා නැතහොත් එසේ නියම සන්තකය දරන යම් තැනැත්තකු නොමැති අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරු අමතා භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ නියමයක් මගින් තත් කාර්යය සඳහා ඒ ස්ථානය බලකර ලබා ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ස්ථානයක් බලකර ලබා ගනු ලැබූ අවස්ථාවක, ඒ බලකර ලබා ගැනීමේ කාලය සති හතරකට වැඩි නො විය යුතු ය.

(3) මේ වගන්තියේ "ස්ථානය" යන්නෙන්, යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් අදහස් වන අතර, පැල්පතක්, මඩුවක් හෝ ඉදිකිරීමක් නැතහොත් එහි යම් කොටසක් ද ඊට ඇතුළත් වේ.

73. (1) 72 වන වගන්තිය යටතේ යම් ස්ථානයක් බලකර ලබා ගනු ලැබූ අවස්ථාවක, ඒ බලකර ලබා ගැනීමට පෙරාතුව ම ඒ ස්ථානයේ නියම සන්තකය දැරූ තැනැත්තාට නැතහොත් එසේ නියම සන්තකය දැරූ තැනැත්තකු නොමැති අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරුට, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් එසේ බලකර ලබා ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් වන්දි ගෙවිය යුතු අතර, ඒ බලකර ලබා ගත් කාලය ඇතුළත ඒ ස්ථානයට සිදු වූ යම් අලාභයක් ද පියවිය යුතු ය.

ස්ථානයක් බලකර ලබා ගැනීම සඳහා වන්දි ගෙවීම.

(2) යම් ස්ථානයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල නිරණය කිරීමේ දී—

(අ) ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු කුලිය හෝ එසේ ගෙවිය යුතු කුලියක් නොමැති අවස්ථාවක, තත් ප්‍රදේශයේ ඒ හා සමාන ස්ථානයකට ගෙවිය යුතු කුලිය, සහ

(ආ) ඒ ස්ථානය බලකර ලබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලකර ලබා ගැනීමට පෙරාතුව ම ඒ ස්ථානයේ නියම සන්තකය දරන තැනැත්තාට ඔහුගේ පදිංචි ස්ථානය හෝ ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීමට නියම වූයේ නම් ඒ වෙනස් කිරීමට ආනුෂංගික වූ සාධාරණ වියදම් වේ නම්, ඒ වියදම්

සැලකිල්ලට ගත යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වන්දි ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තකු වන්දි මුදල සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ නිරණයෙන් අතෘප්තියට පත්වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ නිරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත ලියවිල්ලකින් අභියාචනය කරනු ලැබිය හැකි ය.

74. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, 2 වන වගන්තිය යටතේ වූ නිල ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීමේ දිනය හා ජනමතවිචාරණයක දී ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙර හත්වන දිනය යන මේ දෙදින අතර යම් වේලාවක, ඒ ජනමතවිචාරණයට සම්බන්ධ කරුණු පමණක් අඩංගු එක තැපැල් පණිවුඩයක්, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි නම ඇතුළත්වෙන්නා වූ ඡන්ද හිමියකු වෙත තැපැල් ගාස්තු සඳහා යම් ගෙවීමක් නොමැතිව, සාමාන්‍ය තැපෑලෙන්, යැවීමට පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්ට හිමිකම තිබිය යුතු ය.

ජනමත විචාරණයකට සම්බන්ධ ද්‍රව්‍ය නොමිලයේ තැපෑලෙන් යැවීමට පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට ඇති අයිතිය.

(2) (1) වන උපවගන්තිය මගින් යම් තැනැත්තකු වෙත පිරිනමනු ලැබූ තැපැල් පණිවුඩයක් යැවීමේ අයිතිවාසිකම පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු අතර, ඉන් යම් කොන්දේසියක් අනුව ක්‍රියා කර නොමැති නම්, තැපැල්පතිවරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ ඒ පණිවුඩය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය :—

(අ) ඒ පණිවුඩය පරීක්ෂා කර බැලීම සඳහා විවෘතව තිබිය යුතු අතර, බරින් ග්‍රෑම් තිහක් නොඉක්මවිය යුතු ය ; තව ද

(ආ) ඒ පණිවුඩයේ දිග සහ පළල ද එයට මුද්‍රා තබන, එය පිළියෙළ කරන හා ඒ පිළිබඳව ක්‍රියා කරන ආකාරය ද තැපැල්පතිවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

දේශපාලන ගුවන් විදුලි ප්‍රචාර.

75. (1) ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, 2 වන වගන්තිය යටතේ නිල ප්‍රකාශනය ප්‍රකාශයට පත කිරීමේ දිනයෙන් ආරම්භව, ඡන්ද විමසීම පටන් ගැනීමට පැය හැත්තෑ දෙකකට කලින් අවසන් වන කාලය ඇතුළත, ගුවන් විකාශන පහසුකම් ප්‍රයෝජනයට ගැනීමට සෑම පිළිගත් දේශපාලන පක්ෂයකට ම හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත යම් පිළිගත් දේශපාලන පක්ෂයකට ගුවන් විකාශන කාලය වෙන් කර දීමේ දී, එක් එක් පක්ෂයට—

(අ) ගුවන් විදුලි විකාශන සම්බන්ධයෙන් වන විට, එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාව විනාඩි පහළොවක් නොඉක්මවිය යුතු අවස්ථා තුනකට නොවැඩි වාර ගණනක දී හෝ ප්‍රයෝජනයට ගත හැකි පරිදි විනාඩි හතළිස් පහක් නොඉක්මවන මුළු කාල සීමාවක් ද ;

(ආ) රූපවාහිනී විකාශන සම්බන්ධයෙන් වන විට, එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාව විනාඩි පහළොවක් නොඉක්මවිය යුතු අවස්ථා තුනකට නොවැඩි වාර ගණනක දී හෝ ප්‍රයෝජනයට ගත හැකි පරිදි විනාඩි හතළිස් පහක් නොඉක්මවන මුළු කාල සීමාවක් ද

ප්‍රයෝජනයට ගැනීමට අවසර දෙනු ලබන බවට ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා වගබලා ගත යුතු ය.

(3) ජනමතවිචාරණයක දී ජනතාවට ඉදිරිපත් කරන යෝජනාව හෝ යෝජනා පිළිබඳව විවාද කිරීමට පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකඟ වන අවස්ථාවක, ඒ විවාදය සඳහා අවසර දී ඇති කාලය, ඒ එක් එක් දේශපාලන පක්ෂයට අවසර දෙන ලද කාලය නොඉක්මවන පරිද්දෙන්, ඒ පක්ෂවලට ගුවන් විකාශන පහසුකම් සලසා දීම, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

(4) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය විසින් ගුවන් විකාශන පහසුකම් ප්‍රයෝජනයට ගත යුතු අනුපිළිවෙල—

(අ) පළමු කොට ඒ පක්ෂ අතර එකඟත්වයකින් නිරණය කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) එවැනි එකඟත්වයක් නොමැති විට, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය පරම අභිමතය පරිදි නිශ්චය කරනු ලබන යම් ආකාරයකට කුසපත් ඇදීමෙන් නැතහොත් ඇදීමෙන් නිරණය කරනු ලැබිය යුතු ය.

76. (අ) මේ පනත යටතේ ජනමතවිචාරණයක් පැවැත්වීම පරිපාලනමය වශයෙන් පොදුවේ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය; කොමසාරිස්වරයාගේ බලතල.

(ආ) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන යම් විධාන, නියෝජ්‍ය සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරයන්ට, ජනමතවිචාරණ තේරීම් භාර නිලධරයාට, තේරීම් භාර නිලධරයන්ට, ඡන්ද ස්ථානාධිපතිවරයන්ට සහ වෙනත් නිලධරයන්ට නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය;

(ඇ) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ තමා වෙත පවරන ලද සහ නියම කරන ලද වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම කොමසාරිස්වරයා විසින් කළ යුතු ය.

77. මේ පනතේ යම් විධිවිධානයක් මුලින් ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් දුෂ්කරතාවක් උද්ගත වුවහොත්, යම් විශේෂ හෝ අනපේක්ෂිත කාරණයක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස හෝ, යම් ප්‍රශ්නයක් නැතහොත් කාරණයක් නිරණය කිරීම පිණිස හෝ සැකසුම් කිරීම පිණිස කිසිදු විධිවිධානයක් සලසා නොමැත්තේ ද නැතහොත් ඵලදායී ලෙස විධිවිධානයක් මේ පනතින් සලසා නොමැත්තේ ද එවැනි යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් නිරණය කිරීමේ හෝ සැකසුම් කිරීමේ හෝ කාර්යය පිණිස විධිවිධාන සැලැස්වීමේ අරමුණ ඇතිව, අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන සියලු විධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. දුෂ්කරතා ඉවත් කිරීම.

78. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"මැතිවරණ කොමසාරිස්වරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ;

"ඡන්ද හිමියා", "මැතිවරණ කොට්ඨාසය", "ඡන්ද කොට්ඨාසය", "ඡන්ද ප්‍රදේශය", "ඡන්ද හිමි නාමලේඛනය" සහ "ලියාපදිංචි කිරීමේ නිලධරයා" යන යෙදුම්වල, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතෙහි ඒවාට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"යෝජනාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIII වන පරිච්ඡේදය අනුව, ජනමතවිචාරණයක් මගින් ඉදිරිපත් කළ හැකි යම් කාරණයක් අදහස් වේ; තව ද

"ඡන්දදායකයා" යන්නෙන්, ඡන්ද හිමි නාම ලේඛනයක තමාගේ නම ඇතුළත්ව තිබුණ ද නොතිබුණ ද ජනමත විචාරණයක දී ඡන්දය දීම සඳහා ඉල්ලුම් කරන්නා වූ හෝ ඡන්දය දෙන්නා වූ තැනැත්තෙක් අදහස් වේ.

### පළමුවන උපලේඛනය

### 1981 තැපැල් ඡන්දදායකයන් (ජනමතවිචාරණ) පිළිබඳ නියෝග

ලුහුඬු නාමය.

1. මේ නියෝග 1981 තැපැල් ඡන්දදායකයන් (ජනමතවිචාරණ) පිළිබඳ නියෝග යනුවෙන් සඳහන් කළ හැකි.

අර්ථ නිරූපණය.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල කාර්යය සඳහා—

"නිකුත් කිරීම" යන්නට, මුල් නිකුත් කිරීම සහ පසුව කෙරෙන යම් නිකුත් කිරීමක් ඇතුළත් වේ;

"තැපැල් ඡන්ද පත්‍රිකාව" යන්නෙන්, තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාවක් අදහස් වේ;

"තැපැල් ඡන්දදායකයා" යන්න, ජනමතවිචාරණයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ජනමතවිචාරණයේ කාර්ය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තෙක් ඉන් අදහස් වේ;

"ප්‍රකාශනය" යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශනය අදහස් වේ;

"උපලේඛනය" යන්නෙන්, මේ නියෝගවල උපලේඛනය අදහස් වේ;

"පනත" යන්නෙන්, 1981 ජනමතවිචාරණ පනත අදහස් වේ.

තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට ඉල්ලුම් කිරීමේ ආකෘතිය.

3. තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් උපලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

තැපැල් ඡන්දදායක ලැයිස්තුව හා ඔවුන් පිළිබඳ වාර්තාව.

4. (1) මේ නියෝගයේ විධිවිධානවලට යටත්ව, පනත යටතේ තේරීම් භාර නිලධරයා විසින් තබා ගනු ලබන තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව හා ඔවුන් පිළිබඳ වාර්තාව පහසු යයි ඔහුට පෙනී යන යම් ආකෘතියක විය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයකුගේ ඡන්ද පත්‍රිකාවක් යවනු ලැබිය යුතු ලිපිනය තැපැල් ඡන්දදායක ලැයිස්තුවෙහි ඔහුගේ නමට ඉදිරියෙන් නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(3) තැපැල් ඡන්දදායක ලැයිස්තුවෙහි ඇතුළත් නම්වලට, අනුගාමීව අංක යෙදිය යුතු ය.

(4) තැපැල් ඡන්දදායක ලැයිස්තුව පිළියෙල කරනු ලැබූ වහාම, තේරීම් භාර නිලධරයා විසින් එහි පිටපතක් පරීක්ෂා කිරීම සඳහා තම කාර්යාලයෙහි තැබීමෙන් එය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකාවක ආකෘතිය.

5. තැපැල් ඡන්ද පත්‍රිකාවක්, තැපැල් ඡන්දදායකයන් නොවන ඡන්දදායකයන්ට භාර දෙනු ලබන ඡන්ද පත්‍රිකාවල සහ ඒ ඡන්ද පත්‍රිකාවලින් වෙන් කොට හඳුනා ගත නොහැකි වන පරිදි එම ආකෘතියෙහිම විය යුතු ය.

අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය.

6. තැපැල් ඡන්දදායකයකු වෙත ඔහුගේ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය, උපලේඛනයේ "ආ" ආකෘතියට සරුනුකූල විය යුතු ය.

ලිපිකරුවන් පත් කිරීම.

7. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී තේරීම් භාර නිලධරයාට ලිපිකරුවන් වශයෙන් සහාය වීම සඳහා තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දී සහ ලබා ගැනීමේ දී පෙනී සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.

8. (1) (අ) තේරීම් භාර නිලධරයා සහ ඔහුගේ ලිපිකරුවන්,

(ආ) ජනමතවිචාරණ නියෝජිතයකු,

(ඇ) ජනමතවිචාරණ නියෝජිතයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තකු, සහ

(ඈ) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් නියෝජිතයන්

නොවන වෙනත් කිසිම තැනැත්තකුට තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී පැමිණ සිටිය නොහැකි ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකවර නිකුත් කළ යුතු අවස්ථාවක, එක් එක් ජනමතවිචාරණ නියෝජිතයකු විසින් එක් නියෝජිතයකු බැගින් පත් කරනු ලැබීමට තේරීම් භාර නිලධරයා විසින් බලය දෙනු ලැබිය හැකි සංඛ්‍යාවක් දක්වා වූ ද ඒ කාණ්ඩ සංඛ්‍යාව නොඉක්මවන්නා වූ ද නියෝජිතයන් වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එක් එක් ජනමතවිචාරණ නියෝජිතයකු සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ සංඛ්‍යාව එක සමාන විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලබන තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් ඔවුන් පත් කිරීමේ දැන්වීම, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සඳහා නියමිත වේලාවට කලින්, ජනමතවිචාරණ නියෝජිතයා විසින් තේරීම් භාර නිලධරයාට දිය යුතු ය.

(4) නියෝජිතයකු මිය ගියහොත් හෝ ඔහුට ක්‍රියා කිරීමට නොහැකි වුවහොත්, ජනමතවිචාරණ නියෝජිතයා විසින් එකී නියෝජිතයා වෙනුවට වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරන ලද නියෝජිතයාගේ නම සහ ලිපිනය පිළිබඳ දැන්වීම ලියවිල්ලකින්, තේරීම් භාර නිලධරයාට වහාම භාර දිය යුතු ය.

(5) නියෝජිතයන් පත් කිරීම සහ ඔවුන් පත් කිරීම පිළිබඳ දැන්වීම් තේරීම් භාර නිලධරයාට දීම ජනමතවිචාරණ නියෝජිතයා විසින් කරනු ලැබීම වෙනුවට, ජනමතවිචාරණ නියෝජිතයකු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කරනු ලැබිය හැකි ය.

(6) මේ නියෝගවල නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම්, ස්වකීය පත් වීම් යථා පරිදි කරනු ලැබූ හා දැනුම් දෙනු ලැබූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ නියෝජිතයන් සම්බන්ධයෙන් වන විට, තේරීම් භාර නිලධරයා විසින් බලය දෙන ලද සංඛ්‍යාව ඇතුළත වූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද සලකනු ලැබිය යුතු ය.

(7) ජනමතවිචාරණ නියෝජිතයකු විසින් තමාගේ යම් නියෝජිතයකු පත් කරනු ලැබුවහොත්, ඒ නියෝජිතයාට කිරීමට බලය දෙනු ලැබිය හැකි වූ යම් ක්‍රියාවක් හෝ දෙයක්, ඒ ජනමතවිචාරණ නියෝජිතයා විසින් ම කිරීම හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙහි ලා තමාගේ නියෝජිතයාට සහාය වීම හෝ කරනු ලැබිය හැකි ය.

(8) යම් ක්‍රියාවක් හෝ දෙයක්, ජනමතවිචාරණ නියෝජිතයා හෝ ඔහුගේ නියෝජිතයන් හෝ ඉදිරියේ දී කළ යුතු බවට මේ නියෝගවලින් නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබ ඇති අවස්ථාවක, එවැනි යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ ඒ කාර්යය සඳහා නියමිත වේලාවට එසේ නියමිත ස්ථානයට පැමිණ නොසිටිය ද, ඒ ක්‍රියාව හෝ දෙය අන් සෑම අතින් ම වලංගු පරිදි කර ඇත් නම්, ඒ පැමිණ නොසිටීමෙන් ඒ ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය.

රහස්‍යතා ප්‍රකාශය.

9. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින් ම ඒ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර, උපලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූල රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ වූ ප්‍රකාශයක්, තේරීම් භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු අතර, වෙනත් යම් තැනැත්තකු විසින් එය කරනු ලබන විට, එය තේරීම් භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සම්බන්ධයෙන් කෙරෙන කටයුතුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම ඡන්දය දීමේ රහස්‍යතාව රැක ගැනීම සහ රැකගැනීමෙහිලා ආධාර දීම කළ යුතු අතර—

(අ) නීතියෙන් බලය දෙන ලද යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකා මත කරන ලද නිල සලකුණ පිළිබඳව ඒ කටයුතුවල දී ලබාගත් යම් තොරතුරක් ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර, යම් තැනැත්තකුට දැනුම් දීම; හෝ

(ආ) නීතියෙන් බලය දෙන ලද යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකාවක පිටපැත්තේ සඳහන් අංකය පිළිබඳව ඒ කටයුතුවල දී ලබාගත් තොරතුරක් කවර හෝ අවස්ථාවක යම් තැනැත්තකුට දැනුම් දීම

නොකළ යුතු ය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ මාස හයක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ දැන්වීම.

10. (1) තේරීම් භාර නිලධරයා විසින්, ප්‍රකාශනය පළකිරීමෙන් පසු දින දෙකක් ඉකුත් වීමට පෙර, තමා විසින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන වේලාව සහ ස්ථානය ද, එකී නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ ජනමතවිචාරණ නියෝජිතයා විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව එක් එක් ජනමතවිචාරණ නියෝජිතයාට දැනුම් දිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කරනු ලබන අවස්ථාවක, තමා විසින් එසේ පසුව නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ ජනමතවිචාරණ නියෝජිතයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් සංඛ්‍යාව, ජනමතවිචාරණ නියෝජිතයාට හැකිතාක් ඉක්මනින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා මත නිල සලකුණ යෙදිය යුතු බව.

11. (1) එක් එක් තැපැල් ඡන්දදායකයා වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තේ නිල ලකුණින් මුද්‍රාව තැබීම හෝ නිල ලකුණ එහි සිදුරු කිරීම හෝ කළ යුතු ය; තව ද ඒ ඡන්දදායකයාගේ අංකය සහ නම හඬ නගා කියමින් ඒ එක් එක් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි ඒ ඡන්දදායකයාගේ අංකය ලකුණු කරනු ලැබිය යුතු ය; තව ද ඒ ඡන්ද පත්‍රිකාව ඔහුට නිකුත් කරනු ලැබූ බව දන්වීම පිණිස එහෙත් ඔහුට නිකුත් කරන ලද නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක්දැයි නොදක්වා තැපැල් ඡන්දදායක ලැයිස්තුවෙහි ඔහුගේ නමට ඉදිරියෙන් ලකුණක් තැබිය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවක උපපත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතු ඒ ඡන්දදායකයාගේ අංකය, තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි සඳහන් ඒ ඡන්දදායකයාගේ අංකය විය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රිත අංකය, ඒ ඡන්දදායකයා වෙත යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියෙහි ලකුණු කරනු ලැබිය යුතු ය. එසේ ලකුණු කරන ලද අංකය මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

12. තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඇතුළත් සටහන් දෙකක් එකම තැපැල් ඡන්දදායකයා සම්බන්ධයෙන් වන බවට තේරීම් භාර නිලධරයකු සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් ඒ ඡන්දදායකයා වෙනුවෙන් එක තැපැල් ඡන්ද පත්‍රිකාවකට වැඩි ගණනක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

**තැපැල් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම.**

13. (1) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය, මේ නියෝග වල, "ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යථා පරිදි ලකුණු කොට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහාලන ලද තැපැල් ඡන්ද පත්‍රිකාව සහ යථා පරිදි පුරවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය ආපසු එවීම පිණිස වූ ලියුම් කවරය, මේ නියෝගවල "ආවරණ ලියුම් කවරය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**"ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යන යෙදුමේ සහ "ආවරණ ලියුම් කවරය" යන යෙදුමේ අර්ථ නිරූපණය.**

14. තැපැල් ඡන්දදායකයන් අමතා යවනු ලබන සියලුම ලියුම් කවර තේරීම් භාර නිලධරයා විසින් ගණන් කොට, ඔහු විසින් ළඟම පිහිටි තැපැල් කාර්යාලය වෙත නොපමාවම භාර දෙනු ලැබිය යුතු අතර, එසේ භාර දෙනු ලැබූ ලියුම් කවර ගණන සඳහන් කරමින් තේරීම් භාර නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සි ආකෘතියක්, තැපැල් ස්ථානාධිපති විසින්, තැපැල් කාර්යාලයේ දින මුද්‍රාවෙන් මුද්‍රා තබා, ඒ ලියුම් කවර අමතා ඇති තැනැත්තන් වෙත, ඒවා භාර දෙනු පිණිස ඔහු විසින් වහාම යවනු ලැබිය යුතු ය.

**තැපැල් ඡන්ද දායකයන් අමතා යවනු ලබන ලියුම් කවර තැපැල් කාර්යාලයට භාර දීම.**

15. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසන් කරනු ලැබීමෙන් පසු, තේරීම් භාර නිලධරයා විසින්, හැකිතාක් ඉක්මණින් සහ ජනමතවිචාරණ නියෝජිතයන් ඉදිරිපිට දී:—

(අ) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කළ පිටපත් ; සහ

(ආ) නිකුත් කරනු ලැබූ තැපැල් ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා

වෙන වෙනම පැකැට්ටුවලට දමා ඒ පැකැට්ටු මුද්‍රා තැබිය යුතු ය.

**තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව සහ උප පත්‍රිකා මුද්‍රා තැබීම.**

(2) තැපැල් ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කිරීමේ කාර්යය සඳහා තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කරන ලද පිටපත් ඇතුළත් මුද්‍රා තබන ලද පැකැට්ටුව විවෘත කරනු ලැබිය හැකි අතර, ඒ නිකුත් කිරීම අවසන් වූ පසු මේ නියෝගයේ (1) වන ඡේදය අනුව ඒ පිටපත් නැවතත් පැකැට්ටුවලට දමා මුද්‍රා තබනු ලැබිය යුතු ය.

16. (1) තැපැල් ඡන්දදායකයන් වෙත තැපැල් ඡන්ද පත්‍රිකා මුලින් නිකුත් කිරීමේ කටයුතුවල දී තැපැල් ඡන්දදායකයන්ගෙන් ලැබිය හැකි ආවරණ ලියුම් කවර දැමීම සඳහා ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පෙට්ටි තේරීම් භාර නිලධරයා විසින් සපයනු ලැබිය යුතු ය. එවැනි හැම ඡන්ද පෙට්ටියක්ම පනතේ 38 වන වගන්තියේ කාර්ය සඳහා ඡන්ද පෙට්ටියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි තැබීම.**

(2) මේ නියෝගයේ (1) වන ඡේදයෙහි සඳහන් හැම ඡන්ද පෙට්ටියක් ම පැමිණ සිටින ජනමතවිචාරණ නියෝජිතයන්ට විවෘතව හා හිස්ව පෙන්වා, තේරීම් භාර නිලධරයාගේ මුද්‍රාවෙන් සහ ස්වකීය මුද්‍රා තැබීමට කැමති යම් නියෝජිත යන්ගේ මුද්‍රාවලින් මුද්‍රා තබා, "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය"

යන්න සහ ජනමතවිචාරණය පවත්වනු ලබන මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම ද පෙට්ටියේ ලකුණු කළ යුතු ය. තව ද භාර නිලධරයා විසින්, ඒ ඡන්ද පෙට්ටියේ සුරක්ෂිත භාරය සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

**තැපැල් ඡන්ද දායකයන්ගේ ආවරණ ලියුම් කවර භාර ගැනීම.**

17. ඡන්ද විමසීම අවසාන වීමට පෙර, ආවරණ ලියුම් කවරයක් ලැබුණු වහාම තේරීම් භාර නිලධරයා විසින්, එය විවෘත නොකොට, තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටියෙහි බහාලිය යුතු ය.

**ගණන් කිරීමේ නිලධරයන්.**

18. තැපැල් ඡන්ද ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම සඳහා හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා හෝ ගණන් කිරීමේ නිලධරයකු ද, ඔහුගේ කාර්යය ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය වීම පිණිස සහායකයන් සහ ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද කොමසාරිස්වරයාගේ සාමාන්‍ය සහ විශේෂ විධානවලට යටත්ව තේරීම් භාර නිලධරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔවුන්ගේ ඒ පත්වීම්, තේරීම් භාර නිලධරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

**ගණන් කිරීම පිළිබඳ දැන්වීම.**

19. ඡන්ද විමසීම අවසන් කරනු ලැබූ පසු හැකිතාක් ඉක්මණින් තැපැල් ඡන්ද පත්‍රිකා මගින් දී ඇති ඡන්ද ගණන් කිරීම සඳහා තේරීම් භාර නිලධරයා විසින් විධිවිධාන සැලැස්විය යුතු අතර, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබීමට නියමිත ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම ද, එසේ ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වේලාව ද, පිළිගත් එක් එක් දේශපාලන පක්ෂයක ලේකම්ට හෝ ජනමතවිචාරණ නියෝජිතයාට හෝ ලිඛිතව දැනුම් දිය යුතු ය.

**ගණන් කිරීමේ නිරීක්ෂකයන් පත් කිරීම.**

20. එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ සිටීම සඳහා ඒ ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර (මෙහි මින් මතු "ගණන් කිරීමේ නිරීක්ෂකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නිරීක්ෂකයන් දෙදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන ඒ පත් කිරීම් පිළිබඳ ලිඛිත දැන්වීමක්, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ජනමතවිචාරණ නියෝජිතයා විසින් හෝ ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ගණන් කිරීමේ නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකුගේ නම සහ ලිපිනය එසේ දැනුම් දී නොමැත්තේ ද, ඒ ගණන් කිරීමේ නිරීක්ෂකයා ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

**ගණන් කිරීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.**

21. ගණන් කිරීමේ නිලධරයා, ඔහුට සහාය වීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තන් සහ ගණන් කිරීමේ නිරීක්ෂකයන් හැර, වෙනත් කිසිම තැනැත්තකු ගණන් කිරීමේ නිලධරයාගේ අනුමතය ඇතිව මිස, ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ නොසිටිය යුතු ය.

**ගණන් කිරීමේ දී රහස්‍යතාව රැක ගැනීම.**

22. පනතේ 51 වන වගන්තියේ විධිවිධාන, තැපැල් ඡන්ද ගණන් කිරීමේ කටයුතුවලට අදාළ විය යුතුය.

**තැපැල් ඡන්දදායකයන් ගේ ඡන්ද පෙට්ටිය විවෘත කිරීම.**

23. තැපැල් ඡන්දදායකයන්ගේ සෑම ඡන්ද පෙට්ටියක් ම, ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමෙන් පසුව සහ ඒ නිලධරයා ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ගණන් කිරීමේ නිරීක්ෂකයන් ඉදිරිපිට දී විවෘත කරනු ලැබිය යුතු ය.

**ආවරණ ලියුම් කවර විවෘත කිරීම.**

24. (1) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටියක් විවෘත කරනු ලබන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ ලියුම් කවර සංඛ්‍යාව ගණන් කර, ඒ ගණන සටහන් කරගනු ලැබිය යුතු අතර, ඊට පසු ඒ එක් එක් ආවරණ ලියුම් කවරය වෙන වෙනම විවෘත කරනු ලැබිය යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින් ආවරණ ලියුම් කවරයක් විවෘත කරනු ලැබ, එය තුළ-

(අ) (i) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක්, හෝ

(ii) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක්, හෝ

(iii) අනන්‍යතා ප්‍රකාශයක් පමණක්, හෝ

(iv) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් පමණක්, හෝ

(v) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් පමණක්, හෝ

ඇති බව සොයා ගනු ලබන ; නැතහොත්

(ආ) එහි කිසිවක් නොමැති බව සොයා ගනු ලබන අවස්ථාවක

මේ නියෝගයේ අනුයාත විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මෙම නියෝගයේ (2) වන ඡේදයේ (අ)(i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින් අනන්‍යතා ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට ඇති බවට සහ සාක්ෂි දරනු ලබා ඇති බවටත්, පූර්වෝක්ත (අ)(i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඡන්ද පත්‍රිකා කවරයෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයට ද, පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට ද අනුරූප වන බවටත්, තමා ම සෑහීමට පත් විය යුතු ය. ඔහු එසේ සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ ප්‍රකාශය, (මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනම බඳුනකට ද, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ පූර්වෝක්ත (අ)(ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකාව (මෙහි මින් මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් බඳුනකට ද දැමිය යුතුය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන අවස්ථාවක, මේ නියෝගයේ (3) වන ඡේදයෙන් නියමිත පරිදි, ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් නොවන විටක, ඔහු විසින්,—

(අ) "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ඒ ප්‍රකාශය, පැමිණ සිටින යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකුට පෙන්වනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නිරීක්ෂකයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම්, ඉහතින් වූ (අ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබූ වචනවලට "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී" යන වචන එකතු කරනු ලැබිය යුතු ය ;

(ඇ) පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකා කවරය ද පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකාව ද ඒ ප්‍රකාශයට අමුණිය යුතු ය ; තව ද

(ඈ) ඒ ප්‍රකාශය සහ ඉහතින් වූ (ඇ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන (මෙහි මින් මතු "තැපැල් ඡන්දදායකයන්ගේ, ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) බඳුනක බහාලිය යුතු ය.

(5) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින් "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් සහ කිසිම ඡන්ද පත්‍රිකා

ලියුම් කවරයක් ලැබී නැත" යන වචන අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය.

(6) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iv) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින් "ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත." යන වචන, ඡන්ද පත්‍රිකාවෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය.

(7) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (v) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, අනන්‍යතා ප්‍රකාශයක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහා ඇත්දැයි නිසැකවම දැන ගැනීම පිණිස ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ කවරය විවෘත කරනු ලැබිය යුතු ය.

(8) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ විට, අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකාවක් ඒ ලියුම් කවරය තුළ ඇත්නම් ගණන් කිරීමේ නිලධරයා විසින්, ඒ ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලබා ඇති බවටත් අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි සටහන් කර ඇති ඒ හා සමාන අංකයට අනුරූප වන බවටත් තමා ම සෑහීමට පත් විය යුතු අතර-

(අ) එසේ සෑහීමට පත්වන්නේ නම්, ඒ ප්‍රකාශය, අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු අතර, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය; තව ද

(ආ) එසේ සෑහීමට පත් නොවන්නේ නම්—

(i) "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන ඒ ප්‍රකාශයෙහි සටහන් කළ යුතු ය;

(ii) ඒ ප්‍රකාශය පැමිණ සිටින ගණන් කිරීමේ නිරීක්ෂකයන්ට පෙන්වනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නිරීක්ෂකයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම් ඉහතින් වූ (i) වන අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචනවලට "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී" යන වචන එකතු කිරීම;

(iii) ඒ ප්‍රකාශයට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇමිණීම; සහ

(iv) ඒ ප්‍රකාශය සහ ඉහතින් වූ (iii) වන අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණන ලද ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලීම

කරනු ලැබිය යුතු ය.

(9) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ විට එය තුළ-

(අ) අනන්‍යතා ප්‍රකාශයක් පමණක්; හෝ

(ආ) ඡන්ද පත්‍රිකාවක් පමණක්; හෝ

(ඇ) කිසිවක් නොමැති බව

ගණන් කිරීමේ නිලධරයා විසින් සොයා ගනු ලැබුවහොත්, ඔහු විසින්,—

(i) ඉහතින් වූ (අ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඒ ප්‍රකාශයෙහි "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් ලැබී නැත" යන වචන සටහන් කිරීම;

(ii) ඉහතින් වූ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඒ ඡන්ද පත්‍රිකාවෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත" යන වචන සටහන් කිරීම;

(iii) ඉහතින් වූ (ඇ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. බහා ලූ කිසිවක් ලැබී නැත" යන වචන සටහන් කිරීම; සහ

(iv) අනන්‍යතා ප්‍රකාශයක් හෝ ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ තිබුනේ නම්, ඒ ප්‍රකාශය හෝ ඡන්ද පත්‍රිකාව ඒ කවරයට ඇමිණීම

කරනු ලැබිය යුතු අතර, ඉන්පසු ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඉහතින් වූ (iv) වන අනුඡේදය යටතේ ඒ ලියුම් කවරයට අමුණා ඇති යම් ලේඛනයක් හෝ ලේඛන කිසිවක් වේනොත් ඒ ලේඛනය හෝ ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය.

(10) (2) වන ඡේදයේ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. බහා ලූ කිසිවක් ලැබී නැත" යන වචන ආවරණ ලියුම් කවරයෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ කවරය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය.

(11) අනන්‍යතා ප්‍රකාශයක්, ඒ අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතියේ පිට පැත්තේ සඳහන් උපදෙස් ප්‍රකාර අත්සන් කොට, සාක්ෂි දරනු ලැබ ඇති නම් මිස, යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

**ඡන්ද පත්‍රිකා විවෘත කිරීම.**

25. (1) 24 වන නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි බහාලන ලද එක් එක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය ගණන් කිරීමේ නිලධරයා විසින්, වෙන වෙනම විවෘත කළ යුතු ය.

(2) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක කිසිම ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් නොවන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් "ඡන්ද පත්‍රිකාවක් බහා නොමැත" යන වචන ඒ ලියුම් කවරයෙහි සටහන් කොට, එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්,—

(අ) ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන්නේ නම්, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය; තවද

(ආ) ඒ ලියුම් කවරයෙහි ඡන්ද පත්‍රිකාවක් අඩංගු වන්නේ නම් සහ ඒ ඡන්ද පත්‍රිකාවේ ලකුණු කර ඇති අංකය, ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකයට අනුරූප නොවන්නේ නම්, ඒ කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කොට, ඒ ලියුම් කවරයට ඒ ඡන්ද පත්‍රිකාව අමුණා, එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි බහාලිය යුතු ය.

**ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සහ අනන්‍යතා ප්‍රකාශ මුද්‍රා තැබීම.**

26. 25 වන නියෝගය යටතේ වූ කටයුතු අවසන් වූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ සහ අනන්‍යතා ප්‍රකාශය සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ වෙන වෙනම පැකට්ටු දෙකක බහා ඒ පැකට්ටු මුද්‍රා තැබිය යුතු ය.

**ගණන් කිරීම.**

27. (1) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ඔහු විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, එහි පැමිණ සිටින ගණන් කිරීමේ නිරීක්ෂකයන් ඉදිරිපිට දී, තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි බහා ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගෙන, ඒ බඳුනෙහි තිබූ එම ඡන්ද පත්‍රිකා සංඛ්‍යා ගණන් කොට වාර්තා ගත කරනු ලැබිය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි බහා ඇති ඡන්ද පත්‍රිකාවල ඡන්ද ගණන් කිරීමේ දී පනතේ 34 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති සහ 35 වන සහ 36 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

ගණන් කිරීම අවසන් කිරීම.

28. ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින්—

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා;

(ඇ) පනතේ 35 වන වගන්තියේ (7) වන උපවගන්තිය ප්‍රකාර සකස් කරනු ලැබූ යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය;

(ඈ) 27 (1) වන නියෝගය යටතේ වූ ගණන් කිරීම පිළිබඳ වාර්තාව;

(ඉ) පනතේ 35 වන වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාර පිළියෙළ කරනු ලැබූ ප්‍රකාශය; සහ

(ඊ) 26 වන නියෝගයෙහි සඳහන් මුද්‍රා තබන ලද පැකැට්ටු දෙක

මුද්‍රා තබන ලද පැකැට්ටුවල බහා තේරීම් භාර නිලධරයා වෙත නොපමාව භාර දිය යුතු ය.

## මේ නියෝගවල උපලේඛනය

### " අ " ආකෘතිය

3 වන නියෝගය

### තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රය

අංක ........................................................ දරන මැතිවරණ කොට්ඨාසයේ
(මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම යොදන්න)

තේරීම් භාර නිලධරයා වෙත ය.

.................................. වන මම, .................................. යනුවෙන් මගේ නම ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයෙහි දැක්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි. නාම ලේඛනයෙහි මගේ නම දැක්වෙන්නේ පහත සඳහන් අනුක්‍රමික අංකය, ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය යටතේ වේ :—

ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය : ........................

ඡන්ද කොට්ඨාසයේ අංකය : ........................

මගේ නමට අයත් අනුක්‍රමික අංකය : ........................

තව ද,

*(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ/ශ්‍රී ලංකා නාවික හමුදාවේ/ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, සාමාජිකයකු වශයෙන් ;

*(ආ) පොලිස් දෙපාර්තමේන්තුවේ / ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ / තැපැල් දෙපාර්තමේන්තුවේ / විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ / ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ/.................................. ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

*(ඇ) ජනමතවිචාරණය හා සම්බන්ධිත කාර්ය සඳහා පත් කරන ලද*/පත් කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

*(ඈ) ඒ ජනමතවිචාරණය හා සම්බන්ධිත කාර්ය සඳහා පත්කරන ලද*/පත් කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්—

මාගේ සේවා නියුක්තියේ විශේෂ අවස්ථානුගත කරුණු හේතුවෙන්, මට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව මට ඡන්දය දීමට නොහැකි/නොහැකි වීමට ඉඩ ඇති බැවින්, ජනමතවිචාරණයේ දී මා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට මම මෙයින් ඉල්ලුම් කරමි.

මගේ ඡන්ද පත්‍රිකාව සහ අනිකුත් ලේඛන එවිය යුතු ලිපිනය පහත දැක්වේ :—

පහත දැක්වෙන සටහන ප්‍රකාර සහතික කිරීමේ නිලධරයකු ලෙස කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකම නොමැති නම්, ඉල්ලුම්කරුගේ සහතික කරන නිලධරයාගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න. ......................................

......................................

......................................

සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකම ඇත්නම්, ඉල්ලුම්කරුගේ නිලනාමය සහ ලිපිනය සඳහන් කරන්න.

......................................

දිනය : ........................ ඉල්ලුම්කරුගේ අත්සන.

මා*/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතු කොට ගෙන මට*/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව මට*/ඔහුට ඡන්දය දීමට නොහැකි බව*/නොහැකි වීමට ඉඩ ඇති බව මම මෙයින් සහතික කරමි.

මේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වෙන මගේ නිල නාමය හා ලිපිනය නිවැරදි ය.

දිනය සහ නිල මුද්‍රාව : ........................

......................................

සහතික කරන නිලධරයාගේ*/ඉල්ලුම්කරුගේ
අත්සන සහ නිල නාමය

*අදාළ නොවන වචන කපා හරින්න.

සටහන

1. මේ පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනය පළ කරනු ලැබූ දින සිට, දින දහයක් ඇතුළත, සෑම ඉල්ලුම් පත්‍රයක් ම ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වී සිටින මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක් ම නිසි පරිදි පුරවා තිබිය යුතු ය. එසේ නොවුවහොත් තේරීම් භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේ ය.

3. සෑම ඉල්ලුම්කරුවකුට ම තේරීම් භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ ඔහු එසේ හිමිකම් ලබා නොමැති නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5. "සහතික කිරීමේ නිලධරයා" යන යෙදුම—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන්නා වූ යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට,—

(i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාධිපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාධිපති හෝ ඒ ගුවන් හමුදාවේ හමුදාධිපති නම් නැතහොත් ඒ ඉල්ලුම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ : නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු මෙම අනුච්ඡේදයේ (i) වන කොටසෙහි දක්වෙන තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම් ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ·

(ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු නැතහොත් සේවකයකු වන්නා වූ යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) ඒ ඉල්ලුම්කරු, යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු මේ අනුච්ඡේදයේ (i) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින නිලධරයා ඉන් අදහස් වේ.

'ආ' ආකෘතිය

අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

ආකෘතියේ ඉදිරිපස

**8 වන නියෝගය**

ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය : ...........................................................

(තේරීම් භාර නිලධරයා විසින් ඇතුළත් කිරීම සඳහා)

*(මට දන් භාර දෙන ලද) ඉහත දැක්වෙන අනුක්‍රමික අංකය දරන ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය මගේ අත්සනට සාක්ෂිකරුවකු වන පහත සඳහන් නිලධරයාගේ භාරයේ එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

†(මා දන් ඉදිරිපත් කරන) ඉහත සඳහන් පරිදි අංක යෙදූ ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය තෙළින් ම එවනු ලැබූ තැනැත්තා මා බව, මම මෙයින් ප්‍රකාශ කරමි.

..........................................................

ඡන්දදායකයාගේ අත්සන

දිනය :.................................................

ඉහත නම් සඳහන් තැනැත්තාට මහුගේ සහතික කිරීමේ නිලධරයා වශයෙන් සිටින මා භාරයේ මෙහි සඳහන් කරන ලද ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය එවන ලදි. මා භාරයේ පවත්නා ඒකකයෙහි*/ආයතනයෙහි*/කාර්යාලයෙහි සේවයෙහි නියුක්තව සිටින, ඉහත නම් සඳහන් තැනැත්තා මම පෞද්ගලිකව හඳුනමි.

ඡන්දදායකයා වෙත බාරදෙනු ලැබූ ඡන්ද පත්‍රිකාව ඔහු විසින් මාගේ කාර්යාලයෙහි සපයා දී ඇති ආවෘත ස්ථානය තුළ දී ඔහු විසින් නොපමාව ම ලකුණු කරන ලදි. ලකුණු කරනු ලැබූ ඡන්ද පත්‍රිකාව ඔහු විසින් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ බහාලනු ලැබ, එම කවරය, මා සහ ඡන්දදායකයා ඉදිරිපිට මුද්‍රා තබන ලදි.

ඉහත සඳහන් අනන්‍යතා ප්‍රකාශය ඡන්දදායකයා විසින් ඡන්දය දීමට පෙර, මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

†මා පෞද්ගලිකව හඳුනන ඉහත නම සඳහන් තැනැත්තා විසින් ඉහත සඳහන් ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය මට පෙන්වූ අතර, ඉහත සඳහන් ප්‍රකාශය මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

..........................................................

සාක්ෂිකරුගේ අත්සන සහ නිල නාමය.

දිනය සහ නිල මුද්‍රාව : ............................ ...............

(මේ ආකෘතියේ පිටිපස ඇති උපදෙස් බලන්න)

*අදාළ නොවේ නම් කපා හරින්න.

†ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන තෙළින් ම තම නිල නාමය සහ ලිපිනය යටතේ යවන ලද අවස්ථාවල දී පමණක් අදාළ වන මෙය නොගැළපේ නම් කපා දැමිය යුතු ය. එවැනි ඡන්දදායකයන්ගේ ප්‍රකාශවලට සාක්ෂි දැරීම මෙහි පිටිපස දක්වෙන උපදෙස් පරිදි විය යුතු ය.

## ආකෘතියේ පිටුපස

අ. තම සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයාට උපදෙස්.

1. තම සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයා විසින්, ප්‍රකාශය අත්සන් කරනු ලැබීමට පෙර,—

(i) ඒ නිලධරයා භාරයේ ඡන්දදායකයා වෙත එවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඡන්ද පත්‍රිකාව බහා ලූ ලියුම් කවරය ;

(ii) අනන්‍යතා ප්‍රකාශයෙහි සඳහන් ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය ඔහු අතට භාර දුන් ඡන්ද පත්‍රිකාවේ දක්වෙන අංකය ම බව

දැක බලා ගත යුතු ය.

ඉන්පසු ඡන්දදායකයා විසින්, තම සාක්ෂිකරු වශයෙන් ක්‍රියා කළ යුතු යම් නිලධරයකු ඉදිරිපිට දී ප්‍රකාශය අත්සන් කරනු ලැබිය යුතු ය.

2. ඡන්දදායකයාට එක ඡන්දයක් පමණක් ඇත්තේ ය.

3. ඡන්දදායකයා තමා විසින්, "ඔව්" යන වචනයට වෙන්කර දී ඇති ලකුණ ඉදිරියෙන් හෝ "නැත" යන වචනයට වෙන්කර දී ඇති ලකුණ ඉදිරියෙන් ඡන්ද පත්‍රිකාවේ අකුණු පැත්තේ තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි හතිර ලකුණක් (මෙසේ X) යෙදීමෙන් ඡන්දය දෙනු ලැබිය යුතු ය.

4. ඡන්දදායකයා, තමා ඡන්දය දුන්නේ කවර ආකාරයකට ද යන වග කිසිම තැනැත්තකුට දකිමට ඉඩ නොතැබිය යුතු ය.

5. ඡන්දදායකයා විසින් ඡන්දය දුන් වහාම, ඡන්ද පත්‍රිකාව තමා " ඡන්ද පත්‍රිකා ලියුම් කවරය " යන වචන මතුපිටින් මුද්‍රණය කරනු ලැබ, සපයා ඇති කුඩා ලියුම් කවරය තම සාක්ෂිකරු වෙතින් ලබාගෙන, ලකුණු කරනු ලැබූ ඡන්ද පත්‍රිකාව, ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස නොපෙන්වමින් ලියුම් කවරයෙහි බහා, එය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඉන්පසුව ඡන්දදායකයා සහ ඔහුගේ සාක්ෂිකරු ඉදිරිපිට දී ම ලියුම් කවරය මුද්‍රා තැබිය යුතු ය. ඉන්පසුව ඡන්දදායකයා විසින්, සම්පූර්ණ කරන ලද තම අනන්‍යතා ප්‍රකාශය සමඟ මුද්‍රාව තබන ලද ඡන්ද පත්‍රිකා කවරය තේරීම් භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ බහා, ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවා එය අනුමැදුව යැවීම සඳහා තම සාක්ෂිකරුට භාර දිය යුතු ය.

6. නියමිත ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර, තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත් ද, යථා පරිදි අත්සන් කොට, සාක්ෂි දරනු ලැබූ ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමඟ තිබුණහොත් ද මිස, අනන්‍යතා ප්‍රකාශය ඒ ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

ආ. ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන, කෙළින් ම තමාගේ නිල නාමය සහ ලිපිනය වෙතට යවනු ලැබූ ඡන්දදායකයාට උපදෙස්.

1. ඡන්දදායකයා විසින්, තම අනන්‍යතා ප්‍රකාශය අත්සන් කිරීමට පෙර, ඒ ප්‍රකාශය තමා අත්සන් කළ යුත්තේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද, ඒ තැනැත්තාට—

(අ) ඒ ප්‍රකාශයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති අංකය ම දරන ඡන්ද පත්‍රිකාව ;

සහ

(ආ) අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය හා ඡන්ද පත්‍රිකාව බහා, ඡන්දදායකයා වෙත එවන ලද ලියුම් කවරය

පෙන්වනු ලැබිය යුතු ය.

2. (අ) ඡන්දදායකයා, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන්නේ නම්, ඒ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරලත් නිලධරයකු විය යුතු වූ ද ;

(ආ) ඡන්දදායකයා රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු නැතහොත් සේවකයකු වන්නේ නම් ඒ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු විය යුතු වූ හෝ ඡන්දදායකයාට ජ්‍යෙෂ්ඨ නිලධරයකු නොමැති නම්, ඒ සේවයේ වෙනත් යම් නිලධරයකු විය යුතු

සාක්ෂිකරුවකු ඉදිරිපිට දී ඡන්දදායකයා විසින් අනන්‍යතා ප්‍රකාශය කරනු ලැබිය යුතු ය.

3. ඡන්දදායකයාට එක් ඡන්දයක් පමණක් ඇත්තේ ය.

4. ඡන්දදායකයා විසින්, ඡන්ද පත්‍රිකාවේ දකුණු අත පැත්තේ "ඔව්" යන වචනයට වෙන් කර දී ඇති ලකුණට ඉදිරියෙන් හෝ "නැත" යන වචනයට වෙන් කර දී ඇති ලකුණට ඉදිරියෙන් හෝ තත් කාර්යය සඳහා ඉඩ තබා ඇති ස්ථානයේ "×" මෙසේ කතිරයක් ලකුණු කිරීමෙන් ඡන්දය දිය යුතු ය.

5. ඡන්දදායකයා තමා ඡන්දය දුන්නේ කවර ආකාරයකට ද යන වග කිසිම තැනැත්තකුට දකිමට ඉඩ නොතැබිය යුතු ය.

6. ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් වහාම "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන වචන මතුපිටින් මුද්‍රණය කරනු ලැබ, බහා එවන ලද කුඩා ලියුම් කවරය තුළ, ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව දමා ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඉන්පසුව ඡන්දදායකයා විසින්, අනන්‍යතා ප්‍රකාශය සමඟ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සමඟ තේරීම් භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා, එය අප්‍රමාදව තැපෑලෙන් යැවිය යුතු ය. ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව වහාම ආපසු යවනු නොලැබුවහොත් එය ගණන් කරනු ලැබීමට ප්‍රමාද වූවා වැඩිවිය හැකි ය.

7. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්ද විමසීම අවසාන් කරනු ලැබීමට පෙර තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් යවනු ලැබුවහොත් ද යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමඟ තිබුණහොත් ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

'ඇ' ආකෘතිය

9 (1) වන නියෝගය

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

මට කියවා දෙන ලද, ජනමතවිචාරණ පනතේ පළමුවන උපලේඛනයෙහි අඩංගු නියෝගවල 9 වන නියෝගයේ (3) වන ඡේදය මගින් තහනම් කරනු ලැබ ඇති කිසිවක් මේ කටයුතුවල දී මා නොකරන බවට, මම ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

... ............................................
ප්‍රකාශකගේ අත්සන.

..................................................
ප්‍රකාශය කරනු ලබන්නේ යම් තැනැත්තකු
ඉදිරිපිට දී ද, ඒ තැනැත්තාගේ අත්සන.

දිනය :

සැලකිය යුතුය.— ප්‍රකාශය කරනු ලබන්නේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තා විසින් ප්‍රකාශක වෙත මෙහි සඳහන් කර ඇති ඡේදය කියවා දෙනු ලැබිය යුතු ය.

දෙවන උපලේඛනය

13 වන හා 22 වන වගන්ති

ඡන්දය දීමෙහි ලා ඡන්දදායකයකුට මඟ පෙන්වීම සෑම ඡන්ද පොළක ම පිටතින් සහ සෑම ඡන්ද පොළක ම ඇති සෑම ආවෘත ස්ථානයක ම ප්‍රදර්ශනය කළ යුතු උපදෙස්වල ආකෘතිය.

සෑම ඡන්දදායකයකුට ම එක් ඡන්දයක් තිබිය යුතු ය. ඒ ඡන්දය යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව දෙනු ලැබිය හැකි ය.

ඡන්දදායකයා, ආවෘත ස්ථාන අතුරින් එක් ආවෘත ස්ථානයකට ගොස්, ඡන්ද පත්‍රිකාවේ "ඔව්" යන වචනයට වෙන් කර දී ඇති "ලාම්පුව" ලකුණ ඉදිරියෙන් හෝ "නැත" යන වචනයට වෙන් කර දී ඇති "කළය" ලකුණ ඉදිරියෙන් හෝ ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ කතිර ලකුණක් (මෙසේ ×) යෙදීමෙන් ඡන්දදායකයා විසින්, ඡන්දය දෙනු ලැබිය යුතු ය.

ඉක්බිතිව ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව පිට පැත්තේ නිල ලකුණ ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙනෙන සේ නමා ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළ බහා, ඡන්ද පොළෙන් අප්‍රමාදව ඉවත්ව යා යුතු ය.

ඡන්දදායකයා විසින් අනවධානයෙන් ඡන්ද පත්‍රිකාවක් නරක් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින්, එය ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ආපසු දෙනු ලැබිය හැකි අතර, ඒ අනවධානය පිළිබඳව ඡන්ද ස්ථානාධිපතිවරයා සෑහීමට පත්වන්නේ නම්, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් වෙනත් ඡන්ද පත්‍රිකාවක් දෙනු ලැබිය යුතු ය.

ඡන්දදායකයා යෝජනාවට පක්ෂව සහ විපක්ෂව ඡන්දය දෙනු ලැබුවහොත්, ඔහුගේ ඡන්ද පත්‍රිකාව බලරහිත වන අතර, එය ගණන් කරනු නොලැබේ.

## තුන්වන උපලේඛනය

### "අ" ආකෘතිය

### 15 (2) වන වගන්තිය

### ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස ආකෘතිය

| | | | |
|---|---|---|---|
| උප පත්‍රිකා අංකය :<br>සැලකිය යුතුයි :—<br>ඡන්ද පත්‍රිකාවෙහි පිටපැත්තේ ඇති අංකයට අනුරූප වූ අංකයක් උප පත්‍රිකාවෙහි තිබිය යුතු ය.<br>යෝජනාව සහ "ඔව්" සහ "නැත" යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුද්‍රණය කළ යුතු ය. | මහජනයා වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව, ප්‍රශ්නයක ස්වරූපයෙන් මෙහි සඳහන් කළ යුතු ය. | ඔව්<br>" ලාම්පුව " | |
| | | නැත<br>" කළය " | |

### "ආ" ආකෘතිය

### 21 (2) වන වගන්තිය

21 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර නොදෙනු ලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම: ......................

ඡන්ද ප්‍රදේශය : ............................................................

ඡන්ද කොට්ඨාසය : ............................................................

ඡන්ද පොළ : ............................................................

ඡන්දය විමසීම පවත්වන ලද දිනය : ..............................

| ඡන්ද හිමි නාම ලේඛනයෙහි ඡන්දදායකයාගේ අංකය | ඡන්දදායකයාගේ නම | ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව | | |
|---|---|---|---|---|
| | | උචිත පරීක්ෂණය ප්‍රතික්ෂේප කරයි | උචිත ලකුණින් කලින් සලකුණු කර තිබීම | උචිත ලකුණින් සලකුණු කරනු ලැබීම ප්‍රතික්ෂේප කරයි |
| | | | | |

..................................................

ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.

"ඇ" ආකෘතිය

26 (1) වන වගන්තිය

ප්‍රකාශය

........................................................................................ (ලිපිනය) පදිංචි
..........................................................................................(සම්පූර්ණ නම) වන
මම, මේ මැතිවරණ කොට්ඨාසය සඳහා දැනට බලපැවැත්වෙන ඡන්ද හිමි නාම ලේඛනයේ අ. අං. වශයෙන් නම දැක්වෙන තැනැත්තා මා බව, මෙයින් ප්‍රකාශ කරමි.

...................................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19........ක් වූ ............ මස ......... වන දින දී මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..........................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම: ..............................

ඡන්ද ප්‍රදේශය : ..........................................................

ඡන්ද කොට්ඨාසය : ..........................................................

ඡන්ද පොළ : ..........................................................

"ඇ" ආකෘතිය

26 (1) වන වගන්තිය

ප්‍රකාශය

........................................................... (ලිපිනය) පදිංචි ............................
.................................... (සම්පූර්ණ නම) වන මම, මේ මැතිවරණ කොට්ඨාසයෙහි පවත්වනු ලබන මේ ජනමතවිචාරණයේ දී මෙහි දී හෝ වෙනත් ස්ථානයක දී ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

.....................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ).

19...... ක් වූ ............................ මස ...... වන දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

.....................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම: ........................

ඡන්ද ප්‍රදේශය : ..........................................

ඡන්ද කොට්ඨාසය : ..................................

ඡන්ද පොළ : .........................................

### " ඉ " ආකෘතිය

### 26 (1) වන වගන්තිය

### ප්‍රකාශය

........................................................ (ලිපිනය) පදිංචි ............................
...................................... (සම්පූර්ණ නම) වන මම, මෙම ජනමතවිචාරණයේ දී ඡන්දය දීමට නීතියෙන් අශක්‍යතාවකට පත්ව හෝ නුසුදුසු බවට පත්ව නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

......................................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19...... ක් වූ .................................. මස ...... වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදි.

.....................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම:..................

ඡන්ද ප්‍රදේශය : ................................................

ඡන්ද කොට්ඨාසය : ........................................

ඡන්ද පොළ : ....................................................

### 'ඊ' ආකෘතිය

### 26(1) වන වගන්තිය

### ප්‍රකාශය

.............................................................................. (ලිපිනය) පදිංචි
...............................................................................(සම්පූර්ණ නම) වන
මම, මේ ජනමතවිචාරණයේ දී වෙනත් යම් මැතිවරණ කොට්ඨාසයක දී ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

......................................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19......ක් වූ .................. මස ...... වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදි.

...............................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම : ..............................................

ඡන්ද ප්‍රදේශය : ..................................................................................

ඡන්ද කොට්ඨාසය : ..............................................................................

ඡන්ද පොළ : ........................................................................................

'උ' ආකෘතිය

28 වන වගන්තිය

ප්‍රකාශය

......................... මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි අංක ......................... (අනුක්‍රමික අංකය) දරන ......................... ......................................... (නම) වශයෙන් නම් දක්වෙන තැනැත්තා මා බව ගම්භීරතා පූර්වකව ද අවංකව ද මම ප්‍රකාශ කරමි.

.........................................

(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19...... ක් වූ ............... මස ...... වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

.........................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම : .........................................

ඡන්ද ප්‍රදේශය : .........................................

ඡන්ද කොට්ඨාසය : .........................................

ඡන්ද පොළ : .........................................

'ඌ' ආකෘතිය

28 වන වගන්තිය

ද්විත්ව ඡන්ද ලැයිස්තුව

| ඡන්දදායකයාගේ අංකය | ඡන්දදායකයාගේ නම |
|---|---|
| | |

.........................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

දිනය : .........................

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම : .........................................

ඡන්ද ප්‍රදේශය : .........................................

ඡන්ද කොට්ඨාසය : .........................................

ඡන්ද පොළ : .........................................

"එ" ආකෘතිය

30 වන වගන්තිය

ජන්ද පත්‍රිකා ගිණුම

මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම : ..................................................

ජන්ද ප්‍රදේශය : ..................................................

ජන්ද කොට්ඨාසය : ..................................................

ජන්ද පොළ : ..................................................

ලැබුණු ජන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..................................................

නරක් වූ ජන්ද පත්‍රිකා හැර, නිකුත් කරන ලද ජන්ද පත්‍රිකා සංඛ්‍යාව :..............................

නරක් වූ ජන්ද පත්‍රිකා : ..................................................

පාවිච්චි නොකරන ලද ජන්ද පත්‍රිකා : ..................................................

ලැබුණු ද්විත්ව ජන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..................................................

ජන්දදායකයන්ට නිකුත් කරන ලද ද්විත්ව ජන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..............................

පාවිච්චි නොකරන ලද ද්විත්ව ජන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..................................................

..................................................

(ජන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

දිනය : ..................................................

"ඒ" ආකෘතිය

51 වන වගන්තිය

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

මෙම ජනමතවිචාරණයේ දී මාහට කියවා දී ඇති 1981 ජනමතවිචාරණ පනතේ 51 වන වගන්තියෙන් තහනම් කරනු ලැබ ඇති කිසිවක් නොකරන බවට මම ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

..................................................

(ප්‍රකාශකගේ අත්සන)

19............ක් වූ..................මස ...... වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..................................................

(ප්‍රකාශය ලබාගන්නා තැනැත්තාගේ අත්සන)

සැලකිය යුතුය : ප්‍රකාශය ලබාගන්නා තැනැත්තා විසින්, වගන්තිය ප්‍රකාශකට කියවා දිය යුතු ය.